# නියමුවා

"එබඳු අලුත්, දුෂ්කර සහ ශ්‍රේෂ්ඨ කටයුත්තකදී අඩුපාඩු කම්, දුර්වලකම්, වැරදීම් සිදුවීම වැළැක්විය හැකි නොවේ. සමාජවාදය ගොඩනැගීමේ දුෂ්කරතාවයන්ට බිය වන අය, ඒවායින් තමන් බිය වැදීමට ඉඩ තබන අය, බලාපොරොත්තු සුන් කර ගන්නා සහ බියගුළු ලෙස විමති වන අය, සමාජවාදීහු නොවෙති."

ලෙනින්

තෝරාගත් කෘති,
10 වෙළුම,
129 පිටුව

ISSN 1391 - 1031 | 2022 පෙබරවාරි | 26 වෙළුම | 10 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 40/=




2022.01.19 කොළඹ

# සතුරන් කලබල වීමේ රහසා

# අපේ සාර්ථකත්වයයි!

## ජනතා විමුක්ති පෙරමුණ

පසුගිය 30වැනිදා ගම්පහ, කළගෙඩිහේනේදී පැවැත්වූ ජාතික ජන බලවේගයේ දිස්ත්‍රික් සමුළුවට බිත්තර දමා ගැසීමට තරම් පහත් තත්වයකට පත්වීමෙන් පෙන්නුම් කරන්නේ, සතුරන්ගේ අපේක්ෂාභංගත්වය හා ජාතික ජන බලවේගය ජනතාව අතර ලබමින් තිබෙන සාර්ථකත්වය බව ජනතා විමුක්ති පෙරමුණ පවසයි.


ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ මෙම සිදුවීම පිළිබඳව නියමුවා කරන ලද විමසීමකට පිළිතුරු දෙමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා ආණ්ඩුව දිගින් දිගටම අසාර්ථක වීමත් පවතින අර්බුදයන් හමුවේ ජනතාව, ආණ්ඩුව සහ සාම්ප්‍රදායික විපක්ෂය අතහැර ජාතික ජන බලවේගයත් ජනතා විමුක්ති පෙරමුණත් වටා එක්වෙමින් සිටින බව පෙන්වා දුන්නේය. මෙම තත්වය හමුවේ ආණ්ඩුව සිය කුලීකරුවන් ලවා සමුළුවට බිත්තර ප්‍රහාර එල්ල කර ඇති බවද පසු ගිය 19 දින කොළඹදී පැවැත්වූ පාගමනටද බිත්තර ගැසීමට මෙම කණ්ඩායම උත්සාහ කර ඇති බවද අනාවරණය වී ඇතැයි ඔහු කියා සිටියේය.

"කලගෙඩිහේන සිදුවීමේදී සමුළු පරිශ්‍රයේ ආරක්ෂාවට සිටි අපේ සාමාජිකයින් හා හිතවතුන් ප්‍රහාරයට පැමිණි දෙදෙනෙක් අල්ලා ගත්තා. ඔවුන් පැහැදිලිවම නිශ්ශංක සේනාධිපතිගේ ඇවන්ට්ගාඩ් ආරක්ෂක සේවයට සම්බන්ධ අයයි. එක් අයෙක් සේනාධිපතිගේ ශරීරාරක්ෂකයෙක් ලෙස කටයුතු කරන අයෙක්. ඒ නිසා ප්‍රහාරය සැලසුම් කළේ කවුද කියන එක ඉතාම පැහැදිලියි." ටිල්වින් සිල්වා සහෝදරයා අවධාරණය කළේය. මෙම ඇවන්ට්ගාඩ් ආරක්ෂක ආයතනය ගිනිඅවි සහිත හමුදාවල සේවය කර විශ්‍රාම ගිය පුහුණු සෙබළුන් සහිත සමාන්තර හමුදාවක් ලෙස ක්‍රියාත්මක වන ආයතනයක් බැවින් මෙම ප්‍රහාරය සරල ලෙස සැලකීමට නොහැකිය. විශේෂයෙන් එහි ප්‍රධානියා වන නිශ්ශංක සේනාධිපති පසුගිය කාලයේ ජ.වි.පෙ.ටත් එහි නායක අනුර දිසානායක සහෝදරයාටත් එරෙහිව කර තිබෙන ප්‍රකාශ නිසා මෙම ප්‍රහාරයේ වගකීමෙන් ඔහුට ගැලවිය නොහැක. ඉදිරියේදී මීට වඩා බරපතළ දේ සිදුවිය හැකි අතර එසේ වුවහොත් ඊටද වගකිව යුත්තේ ඔහුය. ජ.වි.පෙ. ප්‍රධාන ලේකම්වරයා පෙන්වා දෙයි.

මේ අතර පක්ෂයේ නායක අනුර දිසානායක >>02 වැනි පිටුවට


### 03 මහදැන මුත්තාගේ විසඳුම්...

වසර ගණනාවක් දුර නොව සති දෙකක දුරක් වත් නොපෙනෙන කිසිදු විෂයයක් පිළිබඳ දැනුමක් අවබෝධයක් නැති, සිහින ලෝකවල සැරිසරන, විධායක බලයට....





### 07 කලාපීය බල වුවමනාව...

2002 වර්ෂයේ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුකාල සීමාවෙන් ඇරඹි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ තුළ...



### 09 වෙනස් කළ නොහැකිද...

සමාජයක දේශපාලන වෙනසක් සඳහා මුලින්ම වෙනස් වන්නේ එම සමාජයේ සිටින සංවේදී හා සවිඥානකම කොටසය. එය ආරම්භයේදී ප්‍රමාණයෙන් කුඩාය. එලෙස සමාජයේ සවිඥානික...




තරුණ.................................. 04
වේදිකාව .............................. 05
ජාත්‍යන්තර.......................... 06
කාන්තා.................................. 08
විශේෂාංග.......................... 10
ඉතිරි....................................... 11


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# ලෙනින් කියවමු! සමරු වැඩසටහන




ලෙනින් සහෝදරයා අභාවයට පත්වී 98 වසරක් පිරීමේ දිනය සමරමින් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය මගින් සමරු වැඩසටහනක් පැවැත්වූ අතර මේ සඳහා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාත්, ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික චන්ද්‍රික අධිකාරී සහෝදරයාත් සහභාගි විය.

රුසියානු විප්ලවය ජයග්‍රහණය වෙනුවෙන් නායකත්වය සැපයූ ලෙනින් යුග පුරුෂයකු ලෙසත්, දාර්ශනිකයෙක්, දේශපාලඥයෙක්, නීතිවේදියෙක්, ආර්ථික විද්‍යාඥයෙක්, මෙන්ම සරල සුන්දර මනුෂ්‍යයකු ලෙසත්, නිර්මාණයන්හි දක්ෂයකු ලෙසත් එසේම සමාජ පරිවර්තනයකදී න්‍යායයන් භාවිතයට ගන්නා හැකියාව සහිත පැති ගණනාවකින් ඉතා හැකියාවන් සහිත පුද්ගලයකු ලෙස හඳුනා ගත හැකි බවත් මෙහිදී ටිල්වින් සිල්වා සහෝදරයා පෙන්වා දුන්නේය. එසේම ලෙනින් සහෝදරයා ආදර්ශයට ගනිමින් ලෙනින් කියවමින්, ලංකාවේ වැඩකරන ජනතාව මේ මොහොතේදී ඔවුන්ගේ ශක්තිය තේරුම් ගනිමින් බලය අත්පත් කරගනිමින් රට ගොඩනැගීම සඳහා සියලු දෙනා පෙළගැසිය යුතු බවත් මෙහිදී ටිල්වින් සිල්වා සහෝදරයා මෙම සාකච්ඡාවේදී පැහැදිලි කළහ.

# පෞද්ගලික අංශයටද වැටුප් වැඩිවිය යුතුයි

## වසන්ත සමරසිංහ



ලක්ෂ 70 ක් වන පෞද්ගලික අංශයෙ සේවකයින්ට ජීවත් වීමට නොහැකි මට්ටමට බඩු මිල ඉහළ ගොස් ඇතැයිද ආණ්ඩුව වහාම බඩු මිල පහත හෙළීමට හා පෞද්ගලික අංශයෙ සේවකයින්ගේ වැටුප් වැඩිකිරීමට කටයුතු කළ යුතුව ඇතැයිද අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා පවසයි. ඔහු මේ බව පැවසුවේ පසුගියදා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේදී පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය.

එසේම මේ රටේ ආර්ථිකයෙන් 80% ක් නියෝජනය කරන්නේ පෞද්ගලික අංශයෙ සේවකයා බවද, ශ්‍රම බලකායෙන් 80% ක් නියෝජනය වෙන්නෙ පෞද්ගලික අංශයෙන් බවත් කඩ පිල්, සාප්පු, ස්වයං රැකියා මේ සියලු දෙනාට ජීවත්වීමේ ප්‍රශ්නයක් තිබෙන බවද වසන්ත සහෝදරයා පෙන්වා දුන්නේය. බදු ගෙවන ජනතාවට සහන දීම ආණ්ඩුවේ වගකීමක් බවද පහුගිය දවස්වල රාජ්‍ය අංශයට රු. 5000ක වැටුප් වැඩිවීමක් ලබාදුන්නා සේම පෞද්ගලික අංශයට සහන දිය යුතු බවද ප්‍රකාශ කළ වසන්ත සමරසිංහ සහෝදරයා, පුළුවන්ද බැරිද කියා මග හැර යාමට ආණ්ඩුවට නොහැකි බවත් පෞද්ගලික අංශයෙ සේවකයගේ වැටුප් වැඩි විය යුතු අවධාරණය කළේය.

ආණ්ඩුවෙ ගණන් බැලීම අනුව 2021 අවුරුද්දෙ ජීවන වියදම රු. 10,000කින් ඉහළ ගොස් ඇති බවද ජීවන අංකය පසුගිය නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා ඒකක 4කින් වැඩිවී ඇති බවත්, උද්ධමනය 12%කින් ඉහළ ගොස් ඇති බවත් මෙතරම් බඩු මිල ඉහළ යද්දී ජනතාවට සහන නොදෙනවනම් පෞද්ගලික අංශයෙ සේවකයන් ලෙස අඛණ්ඩ අරගලයක් දියත් කරන බවත් වසන්ත සමරසිංහ සහෝදරයා මෙහිදී පැවසීය.

# ජීවත්වීමට ඉඩදෙනු! සියලු වතු කම්කරුවන් පෙළගස්වයි



පසුගිය කාලයේ වතු කම්කරුවන් සඳහා රු. 1000 ක පඩි වැඩිකරගැනීමේ අරගලයෙන් එම පඩි වැඩිවීම යෝජනා වුවත් තවමත් එම රු. 1000 පඩි වැඩිවීමක් ලබාදී නොමැති බවත් විවිධ වැවිලි සමගාම් වතු කම්කරුවන්ගේ වැටුප් කප්පාදු කරමින් සිටින බවත් සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ ලේකම් ජේ.එම්.ඒ. ප්‍රේමරත්න සහෝදරයා පවසයි.

මේ නිසා වතු කම්කරුවන්ගේ අතට ලැබෙන්නේ රු. 400, 500, 600 ගණන් වැනි මුදලක් බවත්, මේ සම්බන්ධව ආණ්ඩුවට කරුණු දක්වා ඇති නමුත් මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැති බව පවසන ප්‍රේමරත්න සහෝදරයා, ඔවුන්ගේ ආදායම ඉතා පහළ බැස ඇති අතර හාල්, පොල්, තෙල් ඇතුළු භාණ්ඩ මිල ඉතා ඉහළ යාම නිසා ජීවත්වීමේ බරපතළ ගැටලුවක් මතු වී ඇති බවත් පවසයි. එබැවින් මේ සම්බන්ධව සියලු වතු කම්කරුවන් සම්බන්ධ කරගෙන දැවැන්ත උද්ඝෝෂණ ව්‍යාපාරයක් ඇරඹීමට සංවිධානය වන බවත් එහි මූලික පියවර ලෙස හැටන් නගරයේදී අත්පත්‍රිකා බෙදා හරිමින් වතු කම්කරුවන් දැනුවත් කිරීම ආරම්භ කර ඇති බවත් ඔහු කියා සිටී.

# හෝටල් සේවක ගැටලු වහා විසඳනු! හෝටල් සේවකයෝ උද්ඝෝෂණයේ




කොරෝනා පෙන්වා හෝටල් සේවක රැකියා අහිමි නොකරනු, රු. 5000 දීමනාව හෝටල් සේවකයින්ට ලබාදෙනු, සේවා ගාස්තු වැටුපේ කොටසක් ලෙස සලකනු, කැඩුම් බිඳුම් ගාස්තු සේවා ගාස්තුවෙන් අඩු කිරීම නවතනු, බිඳුණු සේවා මුර ක්‍රමය නවතනු ආදී ප්‍රධාන ඉල්ලීම් කිහිපයක් මුල්කරගෙන හෝටල් සංස්ථා සේවකයින් උද්ඝෝෂණ ක්‍රියාමාර්ග අරඹා ඇත.

ඒ අනුව පසුගියදා කොළඹ කම්කරු කෙමසාරිස් කාර්යාලය ඉදිරිපිටදී එහි එක් උද්ඝෝෂණයක් පැවැත්විණි. මේ සඳහා අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරී සහෝදරයා, හෝටල් සේවක මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක ජයතිලක රණසිංහ සහෝදරයා ඇතුළු හෝටල් සේවක නියෝජිතයෝ රැසක් එක්ව සිටියහ.

# ජනතාවට සිදු වී ඇත්තේ පාලකයින්ගේ විහිළු කතා අහන්නයි

## අයිතීන් උදෙසා කාන්තාවෝ සභාපති සරෝජා සාවිත්‍රී පෝල්රාජ් සහෝදරිය



අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යෑම සහ ආහාර ද්‍රව්‍යවල හිඟය හේතුවෙන් මව්වරුන් ලෙස කාන්තාවන් විශාල පීඩාවකට ලක්වී ඇති බවත් දරුවන්ට, වැඩිහිටියන්ට අවශ්‍ය කිරිපිටි, බෙහෙත් සොයාගැනීමට නොහැකි වී ඇති බවත් පෙන්වා දුන් අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ සභාපති සරෝජා සාවිත්‍රී පෝල්රාජ් සහෝදරිය, ආණ්ඩුවට ඒ සම්බන්ධයෙන් කිසිදු විසඳුමක් නොමැති බවත් ජනතාවට සිදු වී ඇත්තේ සුරංගනා ලෝකවල සිටිනා පාලකයින්ගේ විහිළුවලට සවන් දීමට බවත් ප්‍රකාශ කළාය.

සරෝජා සාවිත්‍රී පෝල්රාජ් සහෝදරිය මේ අදහස් පළ කළේ පසුගිය 23වැනි දින අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය විසින් ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකට එක්වෙමිනි. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ඇය මෙසේද පැවසුවාය.

"අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහිත කන්ටේනර් වරායේ හිරවෙලා ඩොලර් නැති නිසා. ආහාර ද්‍රව්‍ය ගෙන්වන්න ඩොලර් නැහැ කියන ආණ්ඩුව නාස්තිකාර වියදම් කරනවා. ඒ අතරේ ආණ්ඩුව විවිධ කොන්දේසිවලට යටත්වෙලා ණය ගනිමින් ඉන්නවා. ඉන්දියාවෙන් ඩොලර් මිලියන 500ක ණයක් ගන්න යනවා. නමුත් ඒ ණය අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනයට යොදා ගන්න බැහැ. ඒ මගින් කළ හැක්කේ ඉන්දියාවෙන් තෙල් ගන්න එක විතරයි. චීනෙන් ණය ගත්තට කළ හැක්කේ චීනෙන් භාණ්ඩ ගෙන්වීම පමණයි. අත්‍යාවශ්‍ය ආහාර, ඖෂධ ගෙන්වන්න ඩොලර් හොයාගන්න ආණ්ඩුවට වැඩ පිළිවෙළක් නැහැ. ඉදිරි අවුරුදු කාලය එන කොට තත්වය තවත් බරපතළ වෙනවා.

ආණ්ඩුවට ඕන වෙන්නේ තෙල් ඒකාධිකාරය ඉන්දියාවේ අයිඕසී එකට ලබාදෙන්නද? විදුලි බල මණ්ඩලයට අයිඕසී එකෙන් තෙල් ගන්න ගියොත් අපේ රටේ විදුලිය ලැබෙන්නේ ඉන්දියාවට ඕන විදියටයි. මේ විදියට ගියොත් විදුලි බිලත් වැඩි වෙන්න පුළුවන්. ඉදිරියේදී උසස් පෙළ විභාගය එනවා. ඒ නිසා ආණ්ඩුව විදුලි කප්පාදුව ගැන මීට වඩා සැලකිලිමත් විය යුතුයි. අඛණ්ඩ විදුලි සැපයුමක් ගැන ආණ්ඩුවට කිසිදු සැලසුමක් නැහැ. මේ අතර තමයි ජනාධිපතිවරයා කියන්නේ ඉන්ධන අර්බුදය නිසා විදුලියෙන් ක්‍රියාකරන වාහන ලංකාවට ආනයනය කරනවා කියලා. දරුවන්ට පාඩම් වැඩ ටික කරගන්න, කර්මාන්ත ශාලා ටික දුවන්න විදුලිය දෙන්න බැහැ. ඒ අතරේ විදුලියෙන් දුවන වාහන ගෙන්වනවා කියන්නේ මොනතරම් තකතීරු ප්‍රකාශයක්ද? සුරංගනා ලෝකවල ඉන්න පාලකයින්ගේ විහිළුවලට ජනතාවට සවන් දෙන්න වෙලා. හාල් ටික නැහැ, තෙල් ටික නැහැ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟ වෙලා. රටේ පාලකයින් විදුලියෙන් දුවන වාහන ගේන්න කතා කරනවා.

අපේ රටේ අපොහොසත්භාවය කොතරම්ද කියලා පාර්ලිමේන්තුවේ ආණ්ඩුවේ අයගේ කතාවලින් පේනවා. කොවිඩ් නිසා ජනාධිපතිට අවුරුදු දෙකක් නැති වුණාලු. ඒ අවුරුදු දෙක දීර්ඝ කර දෙන්න පාර්ලිමේන්තුවේ යෝජනාවක් ගෙන්න ඕන කියලා ආණ්ඩුවේ මන්ත්‍රීලා කියනවා. මේ වැඩ බැරි ආණ්ඩුවට අත් උදව් සපයන කතා විතරයි. ජනතා වරමට පයින් ගහලා ජනතා විශ්වාසය අහිමි කරගත්ත ආණ්ඩුව පාර්ලිමේන්තුවේ 2/3ක පාවිච්චි කරලා රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති කරන්න හදනවා. ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට අපි කියනවා මහපොළවට බැහැල බලන්න කියලා. තමන්ගේ ප්‍රදේශයේ ඇවිදලා බලන්න ජනතාව ඉන්නේ මොන වගේ මතයකද කියලා. ජනතාව ඉන්නේ ලැබෙන පළවෙනි මොහොතේ මේ ආණ්ඩුව ගෙදර යවන්න බලාගෙන. ඒක තමයි ජනමතය. ඒ නිසා ජනතාවගෙන් විමසන්නේ නැතුව පාර්ලිමේන්තුවේ 2/3ක පාවිච්චි කරන්න හදනවා. ඒ තරම් මේ ආණ්ඩුව පිරිහිලා තියෙන්නේ. මේ ආණ්ඩුව ජනතාවගේ බලාපොරොත්තු ඉටු කළා නම් බය වෙන්න දෙයක් නැහැ. අමුතුවෙන් අවුරුදු දෙකක් දීර්ඝ කරන්න දෙයක් නැහැ. කලට වෙලාවට චන්ද තියන්න තිබුණා. ජනතාව ඉදිරියේ පෙනී ඉන්න තිබුණා. දැන් ජනාධිපතිට, අගමැතිට, මැති ඇමතිවරුන්ට ජනතාව ඉදිරියේ පෙනී ඉන්න බැහැ. ඒ නිසා තමයි ඔවුන් මැතිවරණ අකුළමින් ප්‍රජාතන්ත්‍රවාදය නැති කරමින් කටයුතු කරන්නේ.

මේ අතර ලංකාවේ කෘෂිකර්මාන්තය කඩාවට්ටලා ගොවියට නිෂ්පාදන අවස්ථා අහිමි කරලා දැන් ආණ්ඩුව චීනයෙන් සහල් මෙ.ටො. දශලක්ෂයක් ගෙන්වන්න හදනවා. ගොවියට නිසි වෙලාවට පොහොර ටික දුන්න නම් සහල් ආනයනය කරන්න වෙන්නේ නෑ. දැන් මේ රට චීනයේ, ඉන්දියාවේ කොලනියක් බවට පත් කරන්න උත්සහ කරමින් තිබෙනවා. පෝට් සිටිය ඇතුලේ පොටෝ එකක් ගන්න රුපියල් 30,000ක් ගෙවන්න සිදුවෙලා. මේක තමයි අද අපේ රටේ තත්වය. ලෝකය පුරා ණය වෙලා ණය ගෙවාගන්න බැරිව රටේ සම්පත් විකුණමින් තිබෙන මේ ආණ්ඩුවට රටේ කාන්තාවන්ගේ විරෝධය ප්‍රකාශ කරනවා."

# සතුරන් කලබල වීමේ...

01 පිටුවෙන්..

සහෝදරයා ඇතුළු පක්ෂ නායකයින්ගේ ආරක්ෂාව පිළිබඳව පෙරටත් වඩා වැඩි අවධානය යොමු කර ඒ සඳහා ක්‍රියාමාර්ග රැසක් ගන්නා බව පැවසූ ටිල්වින් සිල්වා සහෝදරයා ගම්පහදී එල්ල කිරීමට පැමිණි ප්‍රහාරය සැලසුම් කළ ලෙස එල්ල කිරීමට ඔවුනට නොහැකි වූයේ පක්ෂය විසින් යොදා තිබූ ආරක්ෂක වැඩපිළිවෙළ නිසා බවද පැවසීය.

මෙවැනි බියගුලු ප්‍රහාරවලින් තමන් බියවැද්දිය නොහැකි බව පැවසූ ඔහු මෙම දුෂ්ට පාලනය පෙරළා දමා ජනතාවගේ පාලනයක් ගොඩනැගීම සඳහා ජාතික ජන බලවේගය ලෙස තව තවත් වේගවත්ව කටයුතු කරන බවද රටට, ජනතාවට හානිකර ඇති, අපරාධ කර ඇති කිසිවෙකුට නීතියෙන් ගැලවීමට ඉඩ නොදෙන බවද අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අර්බුදයට විසඳුම IMFද?

ලංකාව මේ වන විට අතිශය තියුණු සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අර්බුදයකට ලක්ව තිබේ. එය මේ මොහොතේ මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය ලංකා ඉතිහාසයේ මුහුණ දී ඇති විශාලතම අර්බුදය වේ. මේ අර්බුදය අපට සරල ලෙස ප්‍රකාශයට පත්වන්නේ ණය අර්බුදයක් හා විදේශ වත්කම් නොමැති වීමේ අර්බුදයක් ලෙසය. දශක 7කට වැඩි ලාංකේය ධනවාදය තුළත් දශක හතරකට මඳක් වැඩි විවෘත ආර්ථිකය හෙවත් නව ලිබරල් ආර්ථික උපායමාර්ගය තුළත් පාලක පංතියේ වංචා දූෂණ හා නාස්තිය විසිනුත් සිදු කළ තර්කානුකූල අවසානය ලෙස මේ මූල්‍ය අර්බුදය වටහා ගත හැක.

මහ බැංකු වාර්තාවලට අනුව ලංකාවේ 2021 ඔක්තෝබර් අවසන් වන විට ලංකාවේ සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 17,344ක් හෙවත් ට්‍රිලියන 17.34ක් විය. පසුගිය නොවැම්බර් වන විට රට තුළ පැවති විදේශ වත්කම් සංචිතය ඩොලර් මිලියන 1587ක් හෙවත් බිලියන 1.5ක් විය. මේ වසරේ ජනවාරි 18 ඩොලර් මිලියන 500ක ස්වෛරී බැඳුකර ණයක් ගෙවීමත් සමග මේ වත්කම තවත් පහළ වැටී තිබේ. මේ දිනවල රට යන්තම් ගැටගසා ගෙන යන්නේ පසුගිය මාර්තුවේ භාණ්ඩ මිලදී ගැනීමට චීනයෙන් ලැබුණ (යුවාන්වලින්) ඩොලර් බිලියන 1.5ක වටිනාකම ඇති ණයත්, ඉන්දියාවෙන් තෙල් ගැනීම සඳහා ම ලැබුණ ඩොලර් බිලියන 500ක ණයත් ඉන්දියාවෙන්ම බඩු ගැනීමට ලැබීමට නියමිත ඩොලර් බිලියන එකක ණය වැනි ණය මතමය.

මේ වසරේ ණය වාරික, පොලී හා කල්පිරුණු ණය ගෙවීමට ඩොලර් බිලියන 06ක් පමණ අවශ්‍ය වන අතර විදේශ වෙළඳාමේ පාඩුවද කලින් වසරේ මෙන් ඩොලර් බිලියන 6ක් හෝ 7ක් විය හැක. එවිට මේ වසරේ ආණ්ඩුව අඩුම ගණනේ අලුතින් ඩොලර් බිලියන 12ක් හෝ 13ක් ඉපැයිය යුතුය. එහෙත් එය සිතීමට පවා අපහසු ඉලක්කයකි.

මේ තත්වය මත රටට අත්‍යාවශ්‍ය භාණ්ඩ ගෙන්වීම සීමා කිරීමට හෝ නතර කිරීමට ආණ්ඩුවට සිදුව ඇත. දැනටමත් රටට ඉන්ධන ගෙන ඒමේ ගැටලුවක් මතුව තිබේ. දැන් ආණ්ඩුව මුහුණ දී ඇති අභියෝගය වන්නේ ණය ගෙවනවාද, රටට අවශ්‍ය භාණ්ඩ ගෙන්වනවාද යන ප්‍රශ්නයටය. ණය ගෙවීමට පවා නොහැකි තත්වයක පසුවන ආණ්ඩුවට මේ අර්බුදය විසඳීම කළ නොහැකි එකක් වී තිබේ.

ආණ්ඩුව මේ මොහොතේත් උපරිමයෙන් උත්සාහ කරන්නේ ප්‍රධාන කරුණු 3ක් බේරා ගැනීමටය. ඒ ගෙවීමට නියමිත විදෙස් ණයක් ගෙවීමට නොහැකිවීමෙන් මිදීම, නිකුත් කළ ණයවර ලිපියක් (LC) අවලංගුවීම වළක්වා ගැනීමට හා රටට තෙල් ගෙන්වීමට නොහැකි වීම වළක්වා ගැනීමටය. එහෙත් පවතින තත්වය තුළ දිගින් දිගට ඒවා වළක්වා ගැනීමට නොහැකි තත්වයක් මතුව තිබේ.

දැන් ආණ්ඩුව වහාම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යා යුතු බවට ලිබරල් ධනවාදයේ පැත්තෙන් යෝජනාවක් පැමිණ ඇත්තේ මේ තත්වය තුළය. ආණ්ඩුව අභ්‍යන්තරයෙන්ද මේ පිළිබඳව සංවාදයක් පවතී. ඒ නිසාම මේ පිළිබඳ නිවැරදි අදහසක් තිබීම වැදගත් වේ.

ධනවාදී රාජ්‍යයකට එය බංකොලොත් තත්වයෙන් මිදීම සඳහා අවසානයේ යාමට සිදුවන ස්ථානය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල බව අපි දනිමු. පසුගිය ඉතිහාසය පුරාම මුල්‍ය අර්බුදවලදී ධනවාදී රටවල් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට පතා ඇත. මැලේසියාව ඇතුළු ආසියාතික ව්‍යාඝ්‍රයින් ලෙස හැඳින්වූ රටවල් කඩා වැටුණු විටත් 2008 එක්සත් ජනපදයෙන් ඇරඹි මූල්‍ය අවපාතයේදීත් පසුව ග්‍රීසියේ මූල්‍ය අර්බුදයේදීත් එම රටවල් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට පැතීය. එහෙත් ඉන් ජනතාවට සිදුවූ සෙතක් නොවීය. සැබැවින්ම ඒ සෑම විටම සිදුවූයේ ධනේශ්වර මහා පරිමාණ ප්‍රාග්ධන හිමියන්, බිලියනපතියන් තම පැවැත්ම තහවුරු කර ගැනීමය. ඉන් ආර්ථික වශයෙන් ජනතාවට අත්වූ වාසියක් නැත.

පොදුවේ ගත් කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත ගොස් එහි කොන්දේසිවලට අනුව ණය රැගෙන අර්බුදයෙන් ගොඩ ගිය එකදු රටක් හෝ ලොව නැත. සෑමවිටම සිදුවූයේ ජනතාවගේ සහන හා වැටුප් කප්පාදු කරමින්, රාජ්‍ය වියදම් අඩුකරමින් අර්බුදය පොදු ජනතාව මතම තැබීමය.


අපේ රටේ මූල්‍ය අර්බුදයටද විසඳුම ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තුළ නොවේ. අපේ රටේ ආර්ථිකයේ ප්‍රධාන ගැටලුව වී තිබෙන වත්කම් ඉපයීමෙන් තොරව ණය මත යැපෙන ප්‍රතිපත්තිය වෙනස් කර වත්කම් උපයන නිෂ්පාදන ආර්ථිකයකට මාරුවීම හා නාස්තිය, හොරකම නවතා වත්කම් කළමනාකරණය කර ගැනීමය. එය දැන් ධනපති පාලකයන්ට කළ හැකි වන්නේ නැත.

මේ මොහොතේ පවා ආණ්ඩුව අනවශ්‍ය හා වැරදි තීරණ නිසා (අගමැති ප්‍රමුඛ ඇමතිවරු නිවාඩුවට රට යෑම, චීන පොහොර නැවට වන්දි ගෙවීම වැනි) විදේශ මුදල් නාස්ති කරමින් සිටී. අනෙක් අතට ලංකාවට ලබාගත හැකි විදේශ ආදායම් ලබා ගැනීමට අසමත්ව සිටිති. මේ සඳහා හොඳම උදාහරණය විදෙස් ශ්‍රමිකයන්ගේ මුදල් ලැබීම අඩු වීමය. 2021 ජූනි මස සිට දෙසැම්බර් දක්වා ගෙවුණු මාස 7ක කාලය තුළදී පෙර වසරට සාපේක්ෂව විදෙස් ශ්‍රමිකයන්ගෙන් රටට ලැබුණ මුදල් ප්‍රමාණය ඩොලර් මිලියන 2055කින්, එනම් දළ වශයෙන් ඩොලර් බිලියන 2කින් අඩුවී තිබේ. මාස 07කට ඩොලර් බිලියන 2ක් යනු ලොකු මුදලකි. එහෙත් එම මුදල රටට ලබා ගැනීමට ආණ්ඩුව අසමත්වී ඇත. එසේම කාබනික පොහොර අර්බුදය නිසා රටේ තේ කර්මාන්තය හා කෘෂිකර්මාන්තය බිඳ වැටීම නිසාද රටට ලැබෙන විදෙස් මුදල් අඩුවී ඇත.

එබැවින් රටට විදෙස් මුදල් ලැබුණ මාර්ග පවා දුර්වල කර ගනිමින් යන ආණ්ඩුවක් මූල්‍ය අරමුදලට ගිය විට සිදුවන්නේ එහිදී යෝජනා වන කොන්දේසි මඟින් පොදු ජනයා තව තවත් පීඩාවට පත්වීමය. එබැවින් එය විසඳුමක් වන්නේ නැත. එහෙත් දැක්මක් නැති දුර්වල පාලනයකට අවසානයේ තෝරා ගැනීමට සිදුවන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නම් ඊට අප පුදුම විය යුතු නැත.

# ධනවාදයේ අර්බුදය හා ‘මහදැන මුත්තාගේ’ විසඳුම් සොයන ආණ්ඩුව

ලංකාවේ ආර්ථිකයේ අර්බුදය දැන් පවතින්නේ එහි උච්චතම අවස්ථාවේය. එය දැන් සමාජ අර්බුදයක් බවටත් දේශපාලන අර්බුදයක් බවටත් පත් වෙමින් තිබේ. තනි වචනයෙන් කිවහොත් ලංකාවේ ධනවාදී ආර්ථිකය දැන් මිය




පල්ලට යද්දී චීනයෙන්, මියන්මාරයෙන් රසායනික පොහොරෙන් වගා කළ සහල් ආනයනය කරති.

පවතින අර්බුදය ඉදිරියේ ආණ්ඩුව සොයන විසඳුම් මහදැනමුත්තා වර්ගයේ බව අපට පෙනෙන්නේ මේ නිසාය.

දැන් රට විදුලිය අර්බුදයකට මුහුණදී ඇත. එයද

ගොස්ය. එහි නිෂ්පාදන මාර්ග ඵලදායී නැත. ඒවා වත්කම් ඉපදවීමෙන් තොරය. ණය මත යැපෙන ආර්ථිකය අවසන් හුස්මත් හෙළා ඇත. ලංකාවේ දැන් සිදුවන්නේ කුමක්ද? භාණ්ඩ මිල දිනපතා වැඩිවේ. භාණ්ඩ හිඟයක් පවතී. ජනතාව නිතර දිග පෝලිම්වල රස්තියාදු වේ. රටට අවශ්‍ය ඉන්ධන නොලැබීමේ අනතුරක් ඇත. විදුලිය කැපීම නිතර සිදුවේ. රටේ විදේශ වත්කම් පතුළටම සිඳීගොස් ඇත. කෘෂිකර්මාන්තය බිඳ වැටී ආහාර හිඟයක අනතුර මතුව තිබේ. ජනතාව දැන් සිටින්නේ අනාගතය පිළිබඳ අවිනිශ්චිතභාවයකය.

මෙම තියුණු අර්බුදය එක රැයකින් සිදුවූවක් නොව දශක කිහිපයක් තිස්සේ මෙරට පාලකයන් අනුගමනය කළ නිෂ්පාදන මාර්ග නොසලකා හැරීම හා විකුණා දැමීම, ණය මත යැපීම හා වංචාවෙන්, දූෂණයෙන්, නාස්තියෙන් එම ණය විනාශ කර, රට මත ණය බරක් පැටවීම නිසා සිදු වූවකි. වර්තමානයේ පවා පාලක කණ්ඩායම් මේ තත්වය හඳුනාගෙන, එය නිවැරදි කර ගන්නවා වෙනුවට එම මගේම ගමන් කරති.

අර්බුදයෙන් මිදෙන පියවර ගන්නවා වෙනුවට අර්බුදය තුළ ගිලී යන පියවරම ගනිති. වර්තමානයේ අප ඉදිරිපිට ඇති ඛේදවාචකය එයයි.

ධනවාදයේ අර්බුදයට විසඳුම් ධනපති ආණ්ඩු සතුව නැති බව පැහැදිලි සත්‍යයකි. එහෙත් සමහර ධනපති රටවල පාලකයන් අර්බුදය යන්තමින් හෝ කළමනාකරණය කර ගනිති. එහෙත් ලංකාවේ පාලක කණ්ඩායම ඊට වෙනස්ය. මේ අර්බුදය පිළිබඳව එහි බරපතළකම පිළිබඳ වැටහීමක් ආණ්ඩුවට, විශේෂයෙන් විධායක ජනාධිපතිවරයාට නැත. එක්කෝ එය වටහා ගැනීමට වුවමනාවක් නැත. එබැවින් අර්බුදය අභියස ඔවුහු විවිධ ප්‍රහසන රඟ දක්වති; විකාර කථා කියති; මෝඩ තීරණ ගනිති. රට තුළ කුමක් හිඟ වුවත් පාලකයන්ගේ විහිළුවලින් නම් හිඟයක් නැත.

ජනාධිපතිවරයා ‘බබා’ වී තිබේ. රටට දැඩි පාලනයක් ගෙන ඒමට ආ ජනාධිපතිවරයා දැන් රටේ පාලනය මෙන්ම මිල පාලනයද අතහැර තිබේ. ඔහු, තමා විසින්ම තනාගත් සිහින ලොවක ජීවත් වේ. එම සිහින ලෝකයේ ‘හරිත කෘෂිකර්මාන්තය’ දිනපතා දියුණු වේ. කාබනික පොහොර යෙදූ ගොවියෝ මහා අස්වනු ලබති(!) කෘෂිකර්ම ඇමතිද ඊට නොදෙවෙනිය. මෙවර කන්නයේ වී කරල්වල ‘බර’ වැඩිවී ඇතැයි ඔහු කියයි. ඒ, කාබනික පොහොර නිසාය. (සිනහ නොවන්න) එබැවින් කාබනික පොහොරම යොදපල්ලා යැයි ගොවීන්ට අණ කරති. ඒ මතින් කෘෂිකර්මාන්තය වළ

මහදැනමුත්තා වර්ගයේ තීරණ නිසා වූවකි. පසුගිය කාලයේ තෙල් ගෙන්වීම අඩුවීමත් තෙල් සංස්ථාව, විදුලිබල මණ්ඩලයට තෙල් දීම සීමා කිරීමත් නිසා විදුලිබල මණ්ඩලය ජල විදුලිය නිෂ්පාදනය උපරිම ධාරිතාවට පත් කළේය. ඒ අනුව වර්ෂාව සමග පිරී තිබූ ජලාශවල ජලය වැඩිපුර යොදා වැඩිපුර ජල විදුලිය නිපදවීය. එහි ප්‍රතිඵලය වූයේ ඉතා ඉක්මනින් ජලාශ හිඳීයාමය. දැන් වර්ෂාවද නැවතී ඇත. ජලාශ හිඳීයාම නිසා ජල විදුලිය නිපදවීම අඩුවී ඇත. ඒ අතර නොරොච්චෝල ගල් අඟුරු බලාගාරයේ එක විදුලි ජනක යන්ත්‍රයක් කැඩී ඇත. (එය උපන්දා සිටම කැඩෙන එකකි.) මේ තත්වය මත වැඩි විදුලි ඉල්ලුමක් ඇති වෙලාවට ඩීසල් හෝ දැවිතෙල් බලාගාරවල නිපදවන විදුලිය ප්‍රමාණවත් නොවී තිබේ. ඊට අමතරව බලාගාරවලට තෙල් ලබාදීම තෙල් සංස්ථාව විසින් විටින් විට නතර කිරීම නිසා කැලණිතිස්ස වැනි බලාගාර නිතර නතර කිරීමටද සිදුවේ. මෙහි අවසන් ප්‍රතිඵලය වන්නේ විදුලි කප්පාදුවය.

> වසර ගණනාවක් දුර නොව සති දෙකක දුරක් වත් නොපෙනෙන කිසිදු විෂයයක් පිළිබඳ දැනුමක් අවබෝධයක් නැති, සිහින ලෝකවල සැරිසරන, විධායක බලයට, හමුදා බලයට විදුලිය නිපදවීමට, වී ගස්වල කරල් ඇති කිරීමට පවා හැකි යැයි සිතන පාලකයෙක් ප්‍රමුඛ පාලක නඩයකට මේ රටට ලබාදිය හැක්කේ ඇස් රතු වන විහිළු පමණක් බව දැන් පැහැදිලිය.

මෙයට ආණ්ඩුව ගන්නා පියවර මොනවාද? පසුගියදා ජනාධිපතිවරයා මහා භාණ්ඩාගාරයට නියෝග යක් කළේය. ඒ විදුලිබල මණ්ඩලය තෙල් සංස්ථාවට ඇති ණය ගෙවීම සඳහා විදුලි බලමණ්ඩලයට රුපියල් බිලියන 93ක් දෙන ලෙසය. එහෙත් ඉන් ප්‍රශ්නය විසඳෙන්නේ නැත. මන්ද එක් අතකින් තෙල් සංස්ථාවට තෙල් ගෙන්වීම සීමා කිරීමට සිදුව ඇති බැවිනි. ඒ ඩොලර් නැතිකමිනි. තෙල් ගෙන්වීම සඳහා තෙල් සංස්ථාවට ඩොලර් සොයා දෙනවා වෙනුවට විදුලි බල මණ්ඩලයේ ණය භාණ්ඩාගාර මුදලින් ගෙවීම විසඳුමක් වන්නේ නැත. දැනටත් තෙල් ගැනීම සඳහාම ඉන්දියාවෙන් ඩොලර් මිලියන 500ක ණයක්ද ලබාගෙන ඇත. එම තෙල් ඉන්දියාවෙන්ම ගැනීමටද සිදුවනු ඇත. රටේ ඩොලර් නැති ප්‍රශ්නයට විසඳුම් නොසොයා වෙනත් දේ කිරීමෙන් ප්‍රශ්නය විසඳෙන්නේ නැත.

විදුලිබල මණ්ඩලය ජලාශ ඉක්මනින් හිස්කර ගැනීම ලොකු වැරැද්දකි. දැන් තෙල් ලැබී සියලු ඩීසල් බලාගාර ක්‍රියාත්මක වුවද වැඩි විදුලි පරිභෝජනයක් ඇති පැයවලට විදුලිය සැපයීමට නොහැකි තත්වයක් මතුවී ඇත.

මේ අතර ජනාධිපතිවරයාගේ පුනර්ජනනීය බලශක්තිය කතාවලට පමණක් සීමා වී ඇත. දැන් ආණ්ඩුව හදන්නේ මේ විදුලි අර්බුදයද පෙන්වා යුගදනවි LNG බලාගාර ඇමෙරිකාවට දීම සාධාරණ කර ගැනීමටය. ඒ අතර විදුලිය නොකපා ප්‍රශ්නයට විසඳන ලෙස ජනාධිපතිවරයා කී බව ජනමාධ්‍ය වාර්තා කරයි. පුදුම රටකි. විදුලිය නිෂ්පාදනය ආණ්ඩු වූ විට විදුලිය නොකපා ජනපති නියමයෙන් ප්‍රශ්නය විසඳන්නේ කෙසේ දැයි අපට නම් නොවැටහේ. ඒ අතර මහජන උපයෝගීතා කොමිසම පවසා තිබුණේ ඔවුන්ගේ අවසරයකින් තොරව විදුලිය කැපිය නොහැකි බවය. සවස් කාලයේ විදුලිය ඉල්ලුම වැඩිවන විට විදුලිය නිෂ්පාදනය එහි උපරිමයට ළඟා වුවත් එය ප්‍රමාණවත් නොවන විට කැපීම හැර වෙන විකල්පයක් මණ්ඩලයට නැත. එය මහජන උපයෝගීතා කොමිසම අවසර දුන්නත් නැතත් සිදුවේ. මේවා භයානක විහිළුය.

රටේ අනෙක් ප්‍රශ්න අරබයාද ආණ්ඩුවේ හැසිරීම එසේය. කිසිවෙකු කිසිවකට වග නොකියති. පාලකයන් අර්බුදය හෝ එහි හේතු නොදනිති. නොදකිති. ඔවුන්ට මේ විෂයයන් පිළිබඳ අවබෝධයක් නැත. ජනාධිපතිගේ ප්‍රකාශවලට විදුලි නිපදවීම වැඩිකළ නොහැක. එවිට එම ප්‍රකාශ විහිළු බවට පත්වේ. රටට ගෙන්වන තෙල් ප්‍රමාණයෙන් වැඩි පංගුව විදුලිබල මණ්ඩලයට දුන්විට වාහන සඳහා තෙල් සැපයිය නොහැකි බව තෙල් ඇමති ගම්මන්පිල කියන විට ලොකුගේ අමාත්‍යවරයා කියන්නේ තෙල් ලබා නුදුන්නොත් විදුලිය සැපයිය නොහැකි බවය. දැන් අවසන් තීරණය ගැනීමට සිදුවන්නේ ජනතාවටය. ඒ වාහනවලින් ගමන් යමින් කරුවලේ සිටිනවාද? විදුලිය පාවිච්චි කරමින් වාහන ගෙදර තබා පයින් යනවාද යන්නය. මහදැනමුත්තලාට ප්‍රශ්න විසඳීම බාරදුන් විට

11 වැනි පිටුවට





# Yes We Can

## ධනේශ්වර බිත්තර ප්‍රහාර

වත්මන් ධනේශ්වර පාලනය සිය අවසන් කාර්තුවට පැමිණ ඇත. එය සමාජයෙන් මෙන්ම පාලකයාගේ ක්‍රියා කලාපයන්ගෙන්ද පෙන්නුම් කරමින් ඇත. සමාජය දිනෙන් දින කුණු වෙමින්, විනාශයට පත්වෙමින් ඇත. මිනිසුන්ට ජීවත්වීමට නොහැකි ලෙස ආර්ථිකය කුණු වී ඇත. දිනෙන් දින බඩු මිල අහස උසට යමින් ඇත්තේ වෙනදාට වඩා වේගවත් ලෙසය. රුපියල් කෙතරම් තිබුණා වුවද දැන් ඒවාගේ වටිනාකම් හීන වී ඇත. ජීවත් වූ අදායම් මාර්ග ඇහිරී ගොස් ඇත්තේ අදූරදර්ශී පාලකයන්ගේ වරදින්මය. එය කෝවිඩ්වලට බැර කර පාලකයාට අත පිසදාගත නොහැක. මන්ද අප රට දූපත් රාජ්‍යයක් වුවද කෝවිඩ් රෝගයෙන් මෙතරම් බැටකන තෙක් කිසිවක් නොකර එය දේශපාලන ගේම් වෙනුවෙන් පාවිච්චි කළේද මේ පාලකයාම නිසාවෙනි.

ගොවි ජනයා කබලෙන් ලිපටය. දැන් නම් ලිපත් නැත. ජීවත්වීමට පොරබදින මිනිසුන් හා ගැහැනුන් අනෙකා පරයමින් දුවන්නේ සමාජ පැවැත්මට අවැසි මානුෂීය හෝ සමාජීය ගුණාංග කිසිවක් ඉතිරි නොකරගනිමින්ය. ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, හොරකම්, දූෂණ, වංචාවන්, මංකොල්ලකෑම්, මිනීමැරුම්, මත්ද්‍රව්‍ය තරගයේ අවසානය දිව්නසාගැනීම්ය. සමාජය ඇත්තේ දැන් මෙම තත්වයන් වර්ධනය කරමිනි. කුණු වී විනාශවනවා යැයි පැවසුවේ ඒ නිසාවෙනි.

මෙම තත්වය පාලකයින්ගේ හැසිරීම් තුළින්ද මනාවට පෙන්නුම් කරයි. ප්‍රජාතන්ත්‍රවිරෝධී ගමනක් යෑමට අවැසි බලයක් නිර්මාණය කරගෙන ඇත්තේ 20වැනි ව්‍යවස්ථා සංශෝධනය මගිනි. එයටත් නොහැකි තැන විවිධ අනපණත් මගින්ද පාලකයාට අවැසි ලෙස දේශපාලනය කළමනාකාරණය කිරීමට උත්සාහ දරමින් සිටී. නමුත් එය දැන් අසාර්ථක උත්සාහයක් බවට පත්ව ඇත. ගැසට් කොපමණ ගැහුවත් ඒවා වලංගු නොවන්නේ එනිසාය. ආර්ථික උගුලක අපේ රට හිරකර දැමූ මේ අදූරදර්ශී අධිරාජ්‍යගැති, පසුගාමී පාලකයින්ගේ අසාර්ථකත්වය භුක්ති විඳීමට සිදුවී ඇත්තේ මුළු මහත් ජනතාවටය.


ජනතාවගේ ආණ්ඩු විරෝධය දැන් ගැසට්වලින් හෝ තම බලයෙන් හෝ පාලනය කළ නොහැකි බව දන්නා මේ අසමත් ධනේශ්වර පාලකයෝ කුණු වැඩ ඔස්සේ ආණ්ඩු විරෝධී ඇත්ත බලවේග මර්දනය කිරීමේ අසාර්ථක උත්සාහයන් දරමින් සිටිති. තෙල් ටැංකි ඉන්දියාවට විකිණීමට එරෙහිව සංවිධානය වූ ජනතාව ගමන්ගත් විරෝධතාවයට බිත්තර ගැසීමට තැත් කිරීම මෙහි පළමු අවස්ථාවයි. දෙවන අසාර්ථක උත්සාහය වූයේ ගම්පහ පැවැත්වූ ජාතික ජන බලවේගයේ දිස්ත්‍රික් සමුළුවට බිත්තර ගැසීමට ගත් අසාර්ථක උත්සාහයයි. මේ පෙනෙන්නේ ධනේශ්වර පාලනයේ පරාජයේ වියරු වේදනාවයි. නීතිවලින්, අසාර්ථක උත්සාහයන්ගෙන් තම වියරු වේදනාවේ මර්දනය පිට කරන පාලකයින් පරාජයෙන් බේරීමට කළ හැකි සියල්ල කිරීමට පසුබට නොවන බව අමතක නොකළ යුතුය.


එයට මුහුණදීමට නම් වඩාත් සංවිධානගත, දියුණු හා ඉතාම ශක්තිමත් ව්‍යාපාරයක වුවමනාව තදින් දැනිය යුතුය. "නිර්ධන පංතියට සංවිධාන වීම හැර අන් අවියක් නොමැත". නිර්ධන පංතිය උදෙසා බලය ලබාගැනීම යන ජයග්‍රාහී ගමනේ ප්‍රධානම තීරකයා බවට පත්වන්නේ සංවිධාන ශක්තිය බව අමතක නොකළ යුතුය. ඒ වෙනුවෙන් සංවිධාන වෙමු! ශක්තිමත් වෙමු!! ජයග්‍රහණය වෙනුවෙන් පෙළගැසෙමු!!!

## JVP YOUTH වටා තරුණ තරුණියෝ රොද බඳිති

"ජීවිතය ලස්සන කරන සුන්දර රටක් හදන්න - JVP YOUTH එකට සෙට් වෙන්න" යන තේමාව යටතේ රට පුරා තරුණ තරුණියන් දැනුවත් කිරීමේ වැඩටසහනක් සමාජවාදී තරුණ සංගමය මගින් පසුගිය කාලය තුළ සිදු කෙරිණි. ඊට සමගාමීව අන්තර්ජාලය හරහාද සාමාජිකත්වය ලබාගැනීමේ වැඩපිළිවෙළක්ද දියත් කරන ලදී. මෙම වැඩසටහන සඳහා තරුණ තරුණියන්ගේ විශාල ප්‍රතිචාරයක් ලැබී තිබූ අතර එහි දෙවැනි පියවර ලෙස "YOUTH DAY" වැඩසටහන සෑම දිස්ත්‍රික්කයම ආරම්භ විය. මේ වන විට දිස්ත්‍රික්ක ගණනාවක "YOUTH DAY" වැඩසටහන පැවැත්වූ අතර තවත් දිස්ත්‍රික්ක කිහිපයකම එම වැඩසටහන පැවැත්වීමට නියමිතව ඇත.

මෙම YOUTH DAY වැඩසටහන් මාලාවේ පළමු වැඩසටහන කොළඹ දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන ලද අතර එය බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයේදී පැවැත්විණි. ඒ සඳහා පෙරදී අත්වැල් බඳ නොසිටි තරුණ තරුණියෝ විශාල ප්‍රමාණයක් ජවිපෙ යූත් සමග අත්වැල් බැදගැනීමට පැමිණ සිටියහ. මෙම අවස්ථාවට ජවිපෙ නායක අනුර දිසානායක සහෝදරයාද සහභාගි වූ අතර පැමිණ සිටි තරුණ තරුණියන් විසින් ඔහු සමග සුහද පිළිසරදක යෙදීමට එය අවස්ථාව කරගන්නා ලදී. මේ වන විට මොනරාගල, හම්බන්තොට, කුරුණෑගල, මාතලේ ආදී දිස්ත්‍රික්ක ගණනාවක YOUTH DAY වැඩසටහන පවත්වා ඇති අතර මේ සියලු වැඩසටහන් සඳහා තරුණ තරුණියන් විශාල ප්‍රමාණයකගේ සහභාගිත්වය ලැබී තිබීම විශේෂත්වයක් විය.




## නිදහසේ ප්‍රේමය



ආදරණීය වැලන්ටයින්..
හෙට පිපෙන නිදහසට
ගෙන එන්න ආදරය
ඊයේ නොපිපුණ
නිදහසට
ගෙන එන්න ආදරය

ඒ, නිදහසේ රාජ්‍යයකට...
නොපිපුණ ප්‍රේමයක
නිදහසට
නොලැබෙන හීනයක
උදහසට
ගෙන එන්න නිදහසේ
ප්‍රේමය..

ලෝකයා මුදා දුකින්
එතෙර කොට දොම්නස්
සයුරෙන්
සීරුවෙන් මුසුකොට
ප්‍රේමය..
ගව්වක් දුර වෛරය
හෙළා බොල් පොළොවට
පාගා දමා හැර
සැණෙකින්
ගෙන එන්න නිදහසේ
ප්‍රේමය..
සත්‍යය..

උස් නිදහසක මහිමය
බෙදා ලෝසත වෙත
දරා නෙක දිරි සිත්
උස් නිදහසේ ප්‍රේමය
ලොවක් සනසන
හඬන සිත් සරසන..

2022 ජනවාරි 21

# ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වී තිබෙන්නේ

# ජාතික සම්පත් විකුණන් කෑම, ණයට කෑම සහ හොරා කෑමයි

පාර්ලිමේන්තු මන්ත්‍රී
විජිත හේරත් සහෝදරයා

(ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)

ජනාධිපතිතුමා මාස එකහමාරක් කිසිදු හේතුවක් නොමැතිව මේ පාර්ලිමේන්තුව වසා දමා නැවත ආරම්භ කළ මොහොතේ, එතුමා තම කතාවෙන් ප්‍රකාශ කර සිටියේ ජනතාව වෙනුවෙන් යමක් ඉටු කිරීමට නොහැකිවීම ගැනයි. ජනතාවට දුන් පොරොන්දු ඉටුකිරීමට නොහැකි වීමට හේතුව වශයෙන් ඉදිරිපත් කළේ කොරෝනා වසංගතය නිසා එසේ වූ බවයි. ඒ වගේම ඉදිරි වසර තුනේදී දෙන ලද පොරොන්දු ඉටුකරන්නම්. ඒ නිසා මා ගැන විශ්වාස තබන්න, කියන එකයි හරය වුණේ.

පසුගිය වසර දෙකේ පොරොන්දු ඉටුකරන්න නොහැකි වුණේ කොරෝනා නිසා නොවෙයි. නිවෙස්වල ගෑස් පුපුරන්නේ කොරෝනා නිසාද? පොහොර ප්‍රශ්නය ආවේ කොරෝනා නිසාද? ජනාධිපතිතුමා විසිහතර පැයෙන් රසායනික පොහොර නැවැත්වූවා. ඒ ගත්ත වැරදි තීරණය නිසා තමයි ගොවියා මහපාරට ඇද වැටුණේ. හාල් මිල, එළවළු මිල ඉහළ ගියා. ඒ කොරෝනා නිසාද? සීනි මිල රුපියල් 150/- සිට 160-/ දක්වා මිල ඉහළ ගියේ කොරෝනා නිසාද? කූට ව්‍යාපාරිකයන්ට බදු සහන දී, රිසිසේ සීනි ගෙන්වන්ට ඉඩදීපු නිසා. ඒවාට කොරෝනා සමග සම්බන්ධයක් නැහැ.

එදත් ඔය ප්‍රකාශයම තමයි කළේ. එදා කිවුවෙ යුද්දෙ නිසා කිසිවක් කරන්න බැහැ කියලා. යුද්දෙ ඉවර වුණාම රට සුබිත මුදිත කරනවා කිවුවා. ඒ වගේම අද කොරෝනා නිසා කිසිවක් කර ගන්න බැරි වුණු බව ප්‍රකාශ කරනවා; බැරිකම වහගන්න. කොරෝනා තිබුණු රටවල් ආර්ථික වර්ධනය වැඩිකර ගෙන තිබෙනවා. අපේ අසල රටක් බංගලාදේශය ආර්ථික වර්ධන වේගය 3.79යි. විදේශ සංචිතය ඩොලර් බිලියන 45යි. ලංකාවේ ආර්ථික වර්ධන වේගය ඍණ. විදේශ සංචිතය ඩො.බි. 1.2ට බැස්සා. මේ තියෙන්නේ ආණ්ඩුවේ නොහැකියාවයි.

ගොවි ජනතාවට නොමිලේ දුන්නු පොහොර ටික නැති කළා. අද ගොවි ජනතාව ඉල්ලන්නේ නොමිලේ පොහොර නොවෙයි, සල්ලිවලට පොහොර දෙන්න කියලා. අද ගොවි ජනතාවගේ ජීවන තත්වය කඩා වැටිලා. විපතට පත් ජනතාවට වන්දි ගෙවන්න කීවාම එයටත් තහංචි දාලා, එය නොදී ඉන්න කටයුතු කරමින් ඉන්නවා. රටේ ජාතික නිෂ්පාදනය වට්ටලා තිබෙන්නේ. මේ තත්වය ඇතිවෙලා තිබෙන්නේ කොරෝනා නිසා නොවෙයි, ආණ්ඩුවේ වැරදි ආර්ථික ප්‍රතිපත්තිය නිසයි.

### මානව හිමිකම් රැකීමේ හදිස්සිය

එතුමා ප්‍රකාශ කළා, පසුගිය කාලය තුළ කිසිදු මානව හිමිකම් කඩකිරීමක් කළේ නැති බව. පාර්ලිමේන්තුව වැහුව එක, මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් තමයි. ඡන්දය කල් දාන එක, මානව හිමිකම් කඩකිරීමක්. මහර බන්ධනාගාරයේ රජය භාරයේ සිටි රැඳවියන් 11දෙනා වෙඩි තබා ඝාතනය කර දැමීම බරපතළ මානව හිමිකම් කඩකිරීමක්. එදා ඒ සිදුවීම වහන්න සමහර ඇමතිවරු කතා කළා එය ගැටුමක් නිසා සිදුවුණා කියලා. ඒ ගොල්ලන් ගහගත්තා ඒ නිසයි එහෙම වුණේ කියලා. එහෙත් උසාවියේ වෛද්‍ය වාර්තාවලින් හෙළිදරව් වුණා එය වෙඩිතබා ඝාතනය කිරීමක් බවට. ලෝකයේ කුමන රටක හෝ කොරෝනා හැදුණු පුද්ගලයෙකුව වෙඩි තබා මරා දැමුවේ නැහැ. එහෙත් අපේ රටේ රජය භාරයේ හිටපු කොරෝනා හැදුණු සැකකරුවන්ව ඉතා අමානුෂික ලෙස මහ දවාලේ අමු අමුවේ මරා දැම්මා.

ආර්ථිකයේ ඇති බරපතළකම විසින් ජාත්‍යන්තර ප්‍රජාවට ඒත්තු ගන්වන්න උත්සාහ ගන්නවා, අපි මානවහිමිකම් උල්ලංඝනය කරන්නේ නැති බව. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කරනවා ජී.එස්.පී.ප්ලස් බදු සහනය නතර කරන්න හදන කොට කලබල වෙලා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කරන්න කමිටු පත්කරනවා. අවංක වුවමනාවකින් නොවෙයි. රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් නොවෙයි. උතුරේ ජනතාවගේ ඉඩම් ටික නිදහස් කරනවා. අලුත් ව්‍යවස්ථාවක් ගේනවා. මේවා කියන්නේ ජාත්‍යන්තර ප්‍රජාවට. මොකටවත් නොවෙයි ණය ගන්න. අද මේ කඩා වැටිලා තිබෙන ආර්ථිකය ගොඩ ගන්න ඒ අයව රවට්ටලා ණය ටිකක් ගන්න පුළුවන්ද බලන්න උත්සාහ ගන්නවා. ඒ අයව මේවායින් රවටන්න බැහැ. පහුගිය කාලයේ අත්අඩංගුවේ සිටි බොහෝ පිරිස් ආයුධ පෙන්වන්න ගිහිං මරලා දැම්ම සිද්ධි කීයක් වාර්තා වුණාද? එය සාමාන්‍ය මෝස්තරයක් බවට පත්වෙලා. කිසියම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගත්තාට පස්සේ ඔහුව පොලිසිය විසින් උසාවියට ඉදිරිපත් කරලා උසාවියේ නඩු විභාගයකින් පස්සේ තමයි වැරදිකරුද නිවැරදිකරුද යන්න තීරණය කරන්නේ. එතෙක් ඔහුගේ ආරක්ෂාව රජය විසින් දැරිය යුතුයි. නමුත් කී දෙනෙක් අත්අඩංගුවේ සිටියදී, ඒ ආකාරයෙන් මරා දැම්මාද? අද වෙනකොට කී දෙනෙක් මාධ්‍යවේදීන් අත්අඩංගුවට අරගෙන තිබෙනවාද? ඉතාම වැරදි බොරු චෝදනා ඉදිරිපත් කරමින් ඒ කරන අත්අඩංගුවට ගැනීම් මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් නොවෙයිද?

තවත් බරපතළම සිද්ධියක් තමයි මහ බැංකු බැඳුම්කර කොල්ලය. මේ ආණ්ඩුව බලයට පත්වෙන කොට දීපු පොරොන්දුවක් තමයි, ඒ හොරුන්ට අදාළ දඬුවම් වහාම දෙනවයි කී පොරොන්දුව. ඊළඟ එක තමයි පාස්කු ප්‍රහාරය. පාස්කු ප්‍රහාරයේ චූදිතයන්ට දඬුවම් දෙනවා, ජනතාවට යුක්තිය ඉටුකරනවා කියන පොරොන්දුව. හැබැයි මේ කරුණු දෙක ගැන එතුමාගේ කතාවේ සඳහන් වෙන්නේ නැහැ. අද කාදිනල් පියතුමා තොරතුරු සහිතව ඉදිරිපත් කර, ප්‍රකාශ කරනවා, මේ පිටුපස දේශපාලන කුමන්ත්‍රණයක් සිදුවෙලා තිබෙන බව. උන්වහන්සේට, කිතු බැතිමතුන්ට අද ඒත්තු ගිහින් තිබෙනවා මෙය දේශපාලන කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බව. හැබැයි ජනාධිපතිතුමාගේ කතාව තුළින් එය ගිලිහී ගොස් තිබෙනවා. එතුමා හිතාමතාම පාස්කු ප්‍රහාරය අමතක කර තිබෙනවා.



### උපකුලපතිකමට දේශපාලන ලියුම්

එපමණක් නොවෙයි, දේශපාලනයෙන් තොරව සාධාරණව යම් යම් පත්කිරීම් කරන බවට පොරොන්දු වුණා. එය ක්‍රියාවෙන් ඔප්පු කරන බවට වියත්මගෙන් ආ අයත් පුන පුනා කියා සිටියා. නමුත් අද වෙනකොට සමස්ත ආයතන දේශපාලනීයකරණය වෙලා. පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, ඉවත් කිරීම් සියල්ල ජනාධිපතිවරයාට උවමනා ආකාරයට, දේශපාලන වුවමනාවට අනුව තමයි සිද්ධ කරන්නේ. විශ්වවිද්‍යාල උපකුලපතිවරයා කියන්නේ ගෞරවාන්විත තනතුරක්.

වත්මන් පාලනය මේ උපකුලපතිවරුන් පත්කිරීම සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණය කර තිබෙනවා. විශ්වවිද්‍යාල පනතේ, ක්‍රමවේදයට අනුව තමයි උපකුලපතිවරු පත්කරන්නේ. අද එම ක්‍රමවේදයට පයින් ගසා දේශපාලන මන්ත්‍රීවරු ලියුම් දෙනවා උපකුලපතිවරු පත්කරන්න. වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත්කිරීමේ කාර්යය ඉදිරියට තිබෙනවා. දැන් සිටම මන්ත්‍රීවරු ලියුම් ඉදිරිපත් කරනවා උපකුලපතිවරුන් පත්කරන්න. එසේ යවපු ලියුම් කිහිපයක් මා ළඟ තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ප්‍රිය හේරත්, සනත් නිශාන්ත පෙරේරා, කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී බී.වයි.ජී. රත්නසේකර, නාලක බණ්ඩාර කෝට්ටේගොඩ, මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ටී.බී. හේරත්, මේ මන්ත්‍රීවරු අසවල් පුද්ගලයාව විශ්වවිද්‍යාල උපකුලපතිවරු පත් කිරීමට ජනාධිපතිවරයාට ලියුම් යවනවා. උපකුලපතිවරු පත්කරන්න මන්ත්‍රීන්ගේ ලියුම් වුවමනාද? මේ තත්වයට උසස් අධ්‍යාපනය වට්ටලා තියෙන්නේ. සනත් නිශාන්ත පෙරේරා, (එතුමාගේ ලෙටර් හෙඩ් එකෙන්,) පී.වයි.ජී. රත්නසේකර-කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අහවල් පුද්ගලයා විශ්වවිද්‍යාල උපකුලපති ධුරයට පත්කරන්න කියලා. ශ්‍රී ලංකා පොදුජන ආචාර්ය සංගමයේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කැඳවුම්කරු, ධම්මික වීරතිලක ජනාධිපතිට ලියුමක් යවනවා මේ පුද්ගලයා උපකුලපති ධුරයට පත්කරන්න කියලා. (මොහු බැසිල් රාජපක්ෂගේ නඩුවට ඇපයට අත්සන් කළ පුද්ගලයා.) වියත්මග, කුලියාපිටිය, ලේකම්, චින්තක ද සිල්වා, වියත්මග, කුලියාපිටිය, සභාපති, මායාදුන්න සෙනවිරත්න, මේ අය ලියුම් යවනවා ජනාධිපතිට අසවල් පුද්ගලයා උපකුලපති ධුරයට පත් කරන්න කියලා. ලිපියේ මෙසේ සඳහන් වෙනවා. 'මහාචාර්ය එච්.එම්.ජී. හේරත් මහතා අප සමග වර්තමාන ආණ්ඩුව පිහිටුවීමට විශාල කැපවීමක් කළ අතර, ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් සපුරා ඇත.' මේකෙන් පෙන්නුම් කරන්නේ වියත්මග කියා පැමිණි අය, දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න පැමිණි අයත්, ගෞරවාන්විත තනතුරුවලට පත්කිරීමත් අමු අමුවේම දේශපාලනීකරණයට ලක්කරලා තිබෙනවා. උසස් අධ්‍යාපනයට ඇතිවෙලා තිබෙන තත්වය ගැන බරපතළ කනගාටුවක් ඇතිවෙනවා.

### ණය ආර්ථිකය

ආණ්ඩු පක්ෂයේම හිටපු මහ ලේකම්වරයා රෝහණ ලක්ෂ්මන් පියදාස මහාචාර්යතුමා කිවුවා, ඩොලර් මිලියන 500 බැඳුම්කරේ වහාම ගෙවන්න, මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් එයට හදිසි වුණේ ඇයි කියලා. කවුද ඩොලර් මිලියන 500ට මුදල් ආයෝජනය කළේ? ඔවුන් හිතන්නේ ණය ගෙවන්න ලැහැස්ති වෙනවා කියලා. නැහැ. මේ කාරණා හරියට දන්නේ නැහැ මිනිස්සු. ඇත්ත කාරණය බැඳුම්කරවල මුදල් ආයෝජනය කරලා තිබෙන්නේ රාජපක්ෂලාගේ, අජිත් නිවාඩ් කබ්රාල්ලාගේ ඥාතියෝ. හිතවතුන් මිත්‍රයෝ. දේශපාලනිකව මිනිස්සු මෝඩයෝ කරලා, අඥබාලයෝ කරලා මිනිස්සුන්ට කියනවා අපි ණය ගෙව්වා කියලා. එහෙම වෙලා නැහැ. රටේ ජනතාව මේකට අහුවෙන්නේ නැහැ. අද කවුරුත් මේක වැරදියි කිව්වේ නැහැ. විරුද්ධව කරුණු දැක්වුවේ නැහැ. එහෙම නම් මේක සත්‍යයක්. මේ ණය ගෙවන්න සිදුවෙලා තිබෙන්නේ රටේ ජනතාවටයි.

අපේ රට ණය කන්දක හිරවෙලා තිබෙන්නේ. මේ වසර අවසන් වන විට අපේ සමස්ත ණය ප්‍රමාණය ට්‍රිලියන 21ක් වෙනවා. 2020 වෙනකොට ණය ට්‍රිලියන 13ක් අරගෙන තිබුණා. ගෝඨාභය ජනාධිපති වුණු ගමන් ට්‍රිලියන 2ක් ණය ගත්තා. හැබැයි ඊ ස්වීමකදි කියලා තිබුණා මගේ කාලයේ ණය ගත්තේ නැහැ කියලා. හැබැයි වැඩියෙන්ම ණය අරගෙන තිබෙන්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ කාලයේදී. ගත්ත මුළු ණය ට්‍රිලියන 21යි. මේ අවුරුදු 3කට ගන්න ප්‍රමාණය ට්‍රිලියන 8යි. මුළු ණය ප්‍රමාණයෙන් වැඩිපුරම ණය අරගෙන තිබෙන්නේ නන්දසේන රාජපක්ෂගේ පාලන කාලය තුළ. මේ තත්වය ඇතිවෙලා තිබෙන්නේ මේ තිබෙන වැරදි

11 වැනි පිටුවට

# කොවිඩ් ඇති කළ කම්කරු අරගල රැල්ල




2021 වර්ෂය එක්සත් ජනපදයට කම්කරු අරගලයන්ගෙන් පිරී ගිය වසරක් විය. පසුගිය වසර එක්සත් ජනපදයේ කම්කරුවන් ඉන් පෙර නොවූ විරූ තරම් වැඩ වර්ජනයන්ට එක්වූ, ජයග්‍රහණයන් අත්පත් කරගත් වර්ෂයක් මෙන්ම අඩු වැටුප් සහිත රැකියා අත්හැර ගිය වසරක් ලෙසද වාර්තා වී තිබේ. එමගින් පෙන්නුම් කෙරෙන්නේ ලොව විශාලතම ආර්ථිකය හිමි සහ ලොව බලවත්ම රට ලෙස සැලකෙන එක්සත් ජනපදය තුළ, විශේෂයෙන්ම කොවිඩ් 19 වසංගතයෙන් පසුව වර්ධනය වෙමින් පවතින තත්වයයි.

2019 වසරේ සිට පවතින කොවිඩ් 19 ලෝක වසංගතය ධනවාදයේ කෲරත්වය කෙතරම්දැයි ලොව පුරා කම්කරුවන්ට හෙළිදරව් කළේය. මෙම වසංගත සමය තුළදී එක්සත් ජනපදයේ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සහ දේශපාලඥයන් බිඳ වැටෙමින් තිබෙන ව්‍යාපාර යථා තත්වයට පත් කිරීමේ අරමුණින් සේවාවන් 'අත්‍යවශ්‍ය' ලෙස සහ කම්කරුවන් 'වීරයන්' ලෙස නම් කරමින් ඔවුන්ව සේවයට කැඳවනු ලැබිණි. එහිදී ඔවුන්ට වැඩ කිරීමට සිදුවූයේ අඩු වැටුප් සහ අඩු පහසුකම් යටතේ අමතර කැප කිරීම් සිදු කරමිනි.

දක්ෂිණාංශික පණ්ඩිතයෝ සහ දේශපාලඥයෝ වසංගත කාලය පුරාම කම්කරුවන්ගේ හිඟය පිළිබඳ කෑගැසූහ. එය වසංගත සමයේ විරැකියා දීමනාව කප්පාදුවට හේතු සාධක කර ගැනුණි. නමුත් යථාර්ථය වූයේ අවුරුද්ද අවසන් වන විට වාර්තාගත කම්කරුවන් ප්‍රමාණයක් රැකියා හැර යාමය. ඉන් කියැවුණේ කම්කරුවන් තවදුරටත් අඩු පඩි සහ දුෂ්කර තත්වයන් යටතේ වැඩ කිරීමට සූදානම් නොමැති බවය.

එපමණක් නොව පසුගිය කාලය තුළදී එක්සත් ජනපදය තුළ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ගණන් වේගයෙන් ඉහළ යමින් පවතී. එරට කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව 2021 නොවැම්බර් මාසයට සාපේක්ෂව දෙසැම්බර් මාසයේදී පාරිභෝගික මිල දර්ශකය 0.5%කින් වැඩි වී තිබෙන අතර 2020 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2021 දෙසැම්බරයේදී උද්ධමනය 7%කින් වැඩි වී තිබේ. එක්සත් ජනපදය තුළ උද්ධමනය අඛණ්ඩව 5%කට වඩා වැඩිවූ හත් වන මාසය මෙයයි. මේ අතර රට තුළ භාණ්ඩ හිඟයක්ද වර්ධනය වී තිබේ.

අනෙක් අතට එක්සත් ජනපදයට අයත් ලෝකයේ විශාලතම සමාගම් මෙකී කාලය තුළදී වාර්තා ගත ලාභයක් උපයා ගැනීමට සමත් විය; ධනවත්ම පුද්ගලයන්ගේ දේපළ පැටව් ගැසුවේය.

මේ සියලු තත්වයන් විසින් එක්සත් ජනපද කම්කරුවන්ටද සිය අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාමාර්ගවලට එළඹීමට බල කෙරී තිබේ. පසුගිය වර්ෂය තුළදී එක්සත් ජනපදයේ සෑම ක්ෂේත්‍රයක් තුළම කම්කරු අරගල සිදුවී තිබේ; කම්කරුවෝ නව වෘත්තීය සමිති පිහිටුවා ගත්හ; වෘත්තීය සමිති ප්‍රතිසංස්කරණය කර ගත්හ; ඒවාට නව නායකත්වයක් පත් කර ගත්හ.

## වෘත්තීය සමිති

පසුගිය වසරේ වෘත්තීය සමිති පිහිටුවා ගැනීමේ අයිතිය පළමුව දිනා ගනු ලැබුවේ නිව්යෝර්ක්හි Starbucks ආයතනයේ සේවකයන්ය. ඔවුන් එම අයිතිය දිනා ගනු ලැබුවේ එය වැළැක්වීමට පාලකයන් විසින් ගත් දැවැන්ත ක්‍රියාමාර්ග ප්‍රමාණයක් පරාජයට පත් කරමිනි. පසුගිය මැයි මාසයේදී කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපන සේවකයෝ 17,000ක් වෘත්තීය සමිතියක් ලෙස සංවිධානය වීමේ අයිතිය දිනා ගනිමින් මෑත දශකයේදී පිහිටුවනු ලැබූ විශාලතම වෘත්තීය සමිතිය පිහිටුවා ගැනීමට සමත් වූහ. Newsguild නම් මාධ්‍යවේදීන්ගේ වෘත්තීය සමිතිය 2021 වසරේදී ආයතන 26කින් සාමාජිකත්වය 1542 දක්වා වර්ධනය කර ගනිමින් එහි වැඩිම සාමාජිකත්වය වාර්තා කිරීමට සමත් විය.

එක්සත් ජනපදයේ වෘත්තීය සමිති තුළ සංවිධානය වී සිටින්නේ කම්කරුවන්ගෙන් 10%ක් පමණි. එය වෙනසකට ලක් කරමින් 2021 වසරේදී පමණක් පුද්ගලික අංශයේ ආයතන 1314ක කම්කරුවන් වෘත්තීය සමිති ගොඩ නැගීම සඳහා අවසර ඉල්ලා තිබූ අතර ඉන් 907කට වෘත්තීය සමිති ගොඩ නැගීම සඳහා අවසර ලබා දී තිබුණි. ඒ අතරින් 571ක නව වෘත්තීය සමිති පිහිටුවා ගෙන තිබුණි. එය 68%ක වර්ධනයක් වන අතර 1965 වසරෙන් පසුව එක්සත් ජනපදය තුළ වාර්තා වූ ඉහළම අගයයි.

## වැඩවර්ජන

2021 දෙසැම්බර් අග වන විට එක්සත් ජනපදය පුරා වැඩවර්ජන 363ක් වාර්තා වී තිබුණි. එය ප්‍රමාණාත්මක වැඩි වීමක් පමණක් නොවේ. මීට පෙර සිදුවූ වැඩ වර්ජනවලට සාපේක්ෂව මෙම වැඩවර්ජන පැවති කාලයේ සහ ඒවායේ ව්‍යාප්තියේද වර්ධනයක්ද නිරීක්ෂණය කළ හැකිව තිබේ.

පසුගිය වසරේදී ආහාර සැපයුම් සේවාවන්ගේ, අධ්‍යාපන, කාර්මික නිෂ්පාදන, ආහාර නිෂ්පාදනය හා ආකර කර්මාන්තය තුළ දහස් ගණනක් කම්කරුවෝ වැඩවර්ජන ක්‍රියාමාර්ගවලට පිවිසුනහ. ඒ අතරින් විශාලතම වැඩ වර්ජනය වූයේ Newyork Cityහි කොලොම්බියා විශ්වවිද්‍යාලයේ සිදුවූ වැඩ වර්ජනයයි. එහිදී උපාධිධාරී ශිෂ්‍ය සේවකයින් 3000ක් පමණ සාධාරණ වැටුපක් සහ සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම් ඉල්ලා සිටිමින් සති 9කට වැඩි කාලයක් වැඩ වර්ජනයේ යෙදුනහ. එවැනිම වැඩවර්ජනයක් ඊට පෙර ඔක්තෝම්බර් මාසයේදී හාවර්ඩ්හිදීද සිදුවී තිබුණි.

මීට අමතරව John Deer, Kellogg සහ Frito Lay ආයතනවල සේවකයින් වැඩ වර්ජනයේ සහ උද්ඝෝෂණයේ යෙදෙමින් සිය ඉල්ලීම් දිනා ගැනීමට සමත් විය. ක්ෂණික ආහාර සහ සිල්ලර වෙළඳාම් ක්ෂේත්‍රයේ සේවකයෝද වැඩ කාලය දිගු කිරීම, අඩු වැටුප් සහ අඩු පහසුකම්වලට එරෙහිව වැඩවර්ජනයේ යෙදුනහ. මිලියන ගණනකට අත්‍යවශ්‍ය සේවාවන් සපයන Mc Donald සිට Wendy දක්වාත් Walmart සිට Family Dollar දක්වාත් සමාගම් රැසක කම්කරුවෝ වැඩවර්ජනයේ යෙදෙමින් සිය ඉල්ලීම් දිනා ගැනීමට සමත් වූහ.


නිව්යෝර්ක් නුවර බෘක්ලින්හි United Metro Energy හි කම්කරුවන් අප්‍රේල් මාසයේ සිට වැඩවර්ජනයේ යෙදී සිටින්නේ සාධාරණ වැටුපක්, පුළුල් සෞඛ්‍ය රක්ෂණයක් සහ වැඩවර්ජන කාලය තුළදී සේවයෙන් නෙරපූ සේවකයින් නැවත බඳවා ගැනීම සහ ඔවුන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග නොගැනීම යන ඉල්ලීම් මුල් කර ගෙනය. ඇලබාමාහි Worrior Met Coal Mines සමාග මේ ආකර කම්කරුවන් 1100ක් වැඩවර්ජනයේ යෙදී සිටින්නේ තමන්ට ඔරොත්තු දෙන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමවේදයක්, වැටුප් කප්පාදුව නැවැත්වීම සහ වැඩි නිවාඩු ප්‍රමාණයක් ඉල්ලා සිටිමිනි. ජූලි මාසයේදී පෙනිසිල්වේනියාවේ ගෘහස්ථ හෙද සේවිකාවෝ 1500ක් ඓතිහාසික වැටුප් වැඩි වීමක් දිනා ගැනීමට සමත් වූහ. Keiser Permanante රෝහල් සහ සෞඛ්‍ය පහසුකම් ජාලයේ සේවකයින් 35,000ක් වැඩ වර්ජනයකට සූදානම් වූයේ වැටුප් වැඩි වීමක් ඉල්ලා සිටිමින් සහ සේවක හිඟයට පිළියම් යොදන ලෙස බල කරමින්ය. එකී වැඩ වර්ජනය සිදු වූවානම් එය ඉතිහාසයේ විශාලතම සෞඛ්‍ය සේවා වැඩවර්ජනය වන්නට ඉඩ තිබිණි. වැඩවැරීමේ සූදානම දැනුම් දීමෙන් පසු පාලකයින් විසින් ඉල්ලීම් ලබා දීමට එකඟ වීම නිසා වැඩවර්ජනය නවතා දැමිණි. මීට අමතරව 2021 වසර තුළදී එක්සත් ජනපදයේ කම්කරුවෝ වෘත්තීය සමිති තුළට විශ්වාසනීය නායකත්වයක් පත් කර ගැනීමටද වෘත්තීය සමිති නිලවරණයන්හිදී වඩා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයක් දිනා ගැනීමටද සමත් වී සිටිති.

කොවිඩ් 19 වසංගතයේ තෙවන වසරද උදා වී තිබේ. මෙම වසර තුළදීත් පෙර නොවූ විරූ ලෙස ඉහළ ගිය ආදායම් විෂමතාවට හෝ එකතැන පල්වෙන වැටුප් ප්‍රශ්නයට හෝ පිළියම් යෙදීමට පාලකයන්ට නොහැකි වන බැවින් එක්සත් ජනපදය තුළ මතු වී ඇති මෙම කම්කරු අරගල රැල්ල තවදුරටත් වර්ධනය වීම හැර අනෙකක් සිදුවිය නොහැකිය.

## කියුබාව: එන්නත් නිපැයුමෙන් ලෝක විශ්වාසය දිනා

ආර්ථික ඒකාබද්ධතාව සඳහා වන මධ්‍යම ඇමෙරිකානු බැංකුව (CABEI) කොවිඩ් 19 එන්නත් මිලියන 200ක් නිෂ්පාදනය කිරීම සඳහා ඩොලර් මිලියන 46.7ක ණයක් කියුබාව වෙත ලබා දී තිබේ. හොන්ඩුරාස්හි පිහිටි මෙම බැංකුව කියුබාව වෙත ණයක් ලබා දුන් පළමු අවස්ථාව මෙයයි. මෙම ණය මුදල යොදා ගනිමින් කියුබාවේ කොවිඩ් 19 එන්නත් නිෂ්පාදනය, වෛද්‍ය උපකරණ හා ඖෂද නිෂ්පාදනය සංවර්ධනය හා ශක්තිමත් කර ගත හැකි වනු ඇතැයි බලාපොරොත්තු වේ.

## ලෝකය: කොවිඩ් හමුවේ දිළිඳුකම ගෝලීයකරණය වී




කොවිඩ් 19 ලෝක වසංගතය පැවති කාලය තුළදී එනම්, 2020 මාර්තු මාසයේ සිට 2021 නොවැම්බර් දක්වා කාලය තුළදී ලෝකයේ ධනවත්ම පුද්ගලයින් 10 දෙනාගේ වත්කම් දෙගුණ වී ඇතැයි වාර්තා වේ. Oxfam සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තාවකට අනුව මෙම කාලය තුළදී ඔවුන්ගේ වත්කම් ප්‍රමාණය දළ වශයෙන් ඩොලර් මිලියන 700ක සිට ඩොලර් ට්‍රිලියන 1.5 දක්වා වැඩි වී තිබෙන අතර ලෝක ජනතාවගේ 99%කගේ ආදායම් පහත වැටී තිබේ; මිලියන 160කට වැඩි ජනතාවක් දරිද්‍රතාවට ඇද වැටී තිබේ.


## ලෝකය: න්‍යෂ්ටික අවිහරණය තව දුර යයි




ජනවාරි 03 වන දින ලෝකයේ න්‍යෂ්ටික බලය සහිත ප්‍රධාන රාජ්‍යයන් පහ ඒකාබද්ධ ප්‍රකාශනයක් නිකුත් කරමින් න්‍යෂ්ටික යුද්ධයක් ඇති වීම වැළැක්වීමටත් නව න්‍යෂ්ටික ආයුධ නිෂ්පාදනය නැවැත්වීමටත් ඇති සිය සූදානම ප්‍රකාශයට පත් කර තිබේ. එහෙත් එමගින් ඔවුන් පවත්නා න්‍යෂ්ටික අවි යාවත් කාලින කිරීම හෝ වැඩි දියුණු කිරීම නැවැත්වීමට හෝ ලෝකය න්‍යෂ්ටික අවිවලින් තොර තැනක් බවට පත් කිරීමට එකඟ වී නොමැත.

ලෝකයේ න්‍යෂ්ටික අවි නිෂ්පාදනය කරන ප්‍රධාන රාජ්‍යයන් පහ වන එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, චීනය, ප්‍රංශය හා රුසියාව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයින්ය. මීට අමතරව ඉන්දියාව, පකිස්ථානය, ඊශ්‍රායලය සහ උතුරු කොරියාවද න්‍යෂ්ටික අවි දරන රටවල්ය. මෙම රටවල් 9 එක් කොට ගත් විට ලෝකය තුල න්‍යෂ්ටික අවි 13,080ක් ඇති අතර ඉන් 90%ක්ම අයිති වන්නේ රුසියාවට සහ එක්සත් ජනපදයටයි.

## බ්‍රිතාන්‍යය: වෙනිසියුලාවේ රන් ආපසු දෙන ලෙසට බල කෙරී




එංගලන්ත බැංකුව විසින් රඳවාගෙන සිටින වෙනිසියුලාවට අයත් ඩොලර් බිලියන 02ක් පමණ වටිනා රත්රන් ටොන් 31ක් වහාම නිදහස් කරන ලෙසට බල කරමින් ජනවාරි 13 වැනි දින අධිරාජ්‍ය විරෝධී ප්‍රගතිශීලි සංවිධාන ගණනාවක් එම බැංකුව ඉදිරිපිට විරෝධතාවක නිරත විය. එක්සත් ජනපදය විසින් වෙනිසියුලාවට එරෙහිව පනවා ඇති සම්බාධකවලට සහය දක්වමින් බ්‍රිතාන්‍යය විසින් මෙලෙස වෙනිසියුලාවට අයත් රත්රන් තොග රඳවාගෙන සිටියි. වෙනිසියුලානු මධ්‍යම බැංකුව ඊට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ගවලටද පිවිස සිටින මුත් මෙතෙක් ඒ සඳහා යහපත් ප්‍රතිචාර ලැබී නැත.

# කලාපීය බල වුවමනාවේ ගොදුරක් වූ ත්‍රිකුණාමලේ තෙල් ටැංකි

ත්‍රිකුණාමලය තෙල් ටැංකි පද්ධතිය පිළිබඳ සමාජයේ නැවතත් කතාබහක් ඇතිවී තිබේ. ඒ එම ටැංකි පැවරීමට අදාළව ඉන්දියාව සමග ගිවිසුමක් අත්සන් කිරීමට ආණ්ඩුව පියවර ගැනීමත් සමගය. මෙම බලශක්ති අයිතිය අහිමිවීම හමුවේ ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය, ආරක්ෂාව, අනාගත පැවැත්ම තීරණය කිරීමේ අයිතිය ඉන්දියාවට පැවරෙනු ඇති බවට සැක පළ වී ඇත. මේ සටහන එම තෙල් ටැංකි සංකීර්ණයේ වැදගත්කම පෙන්වා දෙයි.


## තෙල් ටැංකි ඉතිහාසය

මෙම තෙල් ටැංකි 1924 දී ඉදිකිරීම් අරඹා 1930 වර්ෂයේදී ඉදිකිරීම නිමවන ලදී. වරාය ආශ්‍රිත අක්කර 850 ක භූමි භාගයක් පුරා එකින් එක නිශ්චිත දුරකින් මෙම තෙල් ටැංකි පිහිටා තිබේ. මෙම තෙල් ටැංකි ඉදිකිරීම් සිදුකර ඇත්තේ බ්‍රිතාන්‍ය පාලන සමයේ බ්‍රිතාන්‍ය ඉංජිනේරුවන් විසිනි. මහා පරිමාණයේ ටැංකි 101 ක් සහිත අංගනයක් ඉදිකර ඇත. මෙම ටැංකි ඉදිකිරීමේදී ඒ වන විට පැවති ඔවුන්ගේ උපරිම තාක්ෂණය භාවිත කර ඇති අතර අඟල් දෙකක් පමණ වන ශක්තිමත් වානේ තහඩුවලින් නිමවා ඇත. රිවට් ඇණ මගින් එකින් එක සම්බන්ධ කරමින් යුදමය තත්වයකදී සිදුවිය හැකි හානි අවම කරගැනීමත් ලවණ සහිත මුහුදු සුළඟින් ආරක්ෂා වීමටත් ශක්තිමත් වානේ යොදාගෙන ඉදිකිරීම් සිදුකර ඇත. දෙවන ලෝක යුධ ගිනි දැල් මැද මරාගෙන මැරෙන ජපන් ගුවන් යානයක් කඩා වැටීම නිසා 1942 අප්‍රේල් 09 වන දින එක් ටැංකියක් ගිනිගෙන විනාශ වී ඇත. එය දින හතක් පුරා ගිනිගෙන දැවුණු බව වාර්තා වී ඇත. 1960දී අත්වැරදීමකින් බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් යානයක් කඩා වැටී තවත් ටැංකියක් විනාශ වී ඇත. මේ අනුව මේ වන විට ටැංකි 99 ක් ඉතිරිව ඇත.

## තෙල් ටැංකිවල ස්වභාවය

ඉතාමත් දියුණු සහ කාර්යක්ෂම නල පද්ධතියක් සහ පොම්පාගාර 2කින් සමන්විත වේ. මෙම පොම්පාගාර දැනුදු නවීන පහසුකම්වලින් යුක්ත වුවත් වටිනා මෙවලන් බොහොමයක් සොරුන් විසින් ගලවාගෙන ගොස් ඇත. ටැංකි අංගන තුනකින් සහ ටැංකි පෙරන, ඉවතලන වැල්ව මෙන්ම ජලය ඉවත් කරන ක්‍රමෝපායද සහිත උපාංග මෙන්ම ඒ ආශ්‍රිත යටිතල පහසුකම් රාශියකින් සමන්විතව පවතී. (01) මුහුද ආසන්නයේ පහත් මට්ටමක ඇති (Lower tank farm) ටැංකි 14 (02) අතර මැදි මට්ටමේ (Intermediate tank farm) (03) ඉහළ මට්ටමේ ටැංකි අංගනය (Upper tank Farm) (04) පහළ මට්ටමේ ටැංකි අංගනයට අනුබද්ධ පොම්පාගාර දෙක (එක පොම්පාගාරයක් මුහුදේ ජැටියක ආකාරයෙන් නැව්වලින් තෙල් ගොඩ බෑමට සහ නැව්වලට සැපයීමටත් අනෙක් පොම්පාගාරය ඉහළ අංගනවල තෙල් සැපයීමට සහ තෙල් මිශ්‍ර කිරීම් සඳහා තෙල් සැපයීමටද භාවිතා කොට ඇත) (05) ඉහළ ටැංකි අංගනය අභ්‍යන්තරව චීන වරාය දුම්රිය නැවතුමේ සිට දිවෙන දුම්රිය මාර්ගය (තෙල් ප්‍රවාහන ටැංකි සඳහා තෙල් සැපයිය හැකි උපාංග සහ මෙවලම්වලින් සමන්විතය) (06) අති දියුණු මෙවලම් සහිත ගිනි නිවීමේ පද්ධතිය

එක ටැංකියක ධාරිතාව මෙට්‍රික් ටොන් 12,000 ක් වන අතර ඉතිරිව පවතින සමස්ත ටැංකි පද්ධතියේ ධාරිතාව මෙට්රික් ටොන් 11,88,000 එනම් මෙට්රික් ටොන් දොලොස් ලක්ෂයකට ආසන්නය. ඉහළ අංගනය යාබදව පිහිටන දුම්රිය මාර්ගය ඔස්සේ රට පුරාම දුම්රිය මගින් තෙල් ඩිපෝ වෙත තෙල් ප්‍රවාහනය විධිමත්ව සහ කාර්යක්ෂමව සිදුකිරීම මෙම ටැංකි අංගනය මගින් පහසුවෙන් සිදුකොට ගත හැකිය. ශ්‍රී ලංකාව තුළ තෙල් ගබඩා ප්‍රාදේශීය ඩිපෝ පිහිටා ඇත්තේ දුම්රිය මාර්ග අසබඩය.



## තෙල් ටැංකි සංකීර්ණයේ අයිතිය

මෙම තෙල් ටැංකි සංකීර්ණය බ්‍රිතාන්‍ය නාවික හමුදාව මගින් පාලනය කරන ලද අතර මෙම අක්කර 677ක භූමිය ශ්‍රී ලංකා රජය විසින් වසර 99 ක කාලයක් සඳහා බ්‍රිතාන්‍ය රජයේ අධි අද්මිරාල් සාමිවරයාගේ කොමසාරිස්වරුන්ට බදු දෙනු ලැබ තිබුණි. 1961 අංක 28 දරන ඛනිජ තෙල් පනත මගින් ඛනිජ තෙල් ඒකාධිකාරිය ශ්‍රී ලංකා රජයට පවාරාගෙන තෙල් ගෙන්වීම, බෙදාහැරීම, විකිණීම සහ මිශ්‍ර කිරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පවරන ලදී. මෙම පනත මගින් 1961දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බිහිවීමත් සමගම තෙල් ගබඩා කිරීම, ගොඩබෑම, සහ බෙදාහැරීම විධිමත්ව සහ කාර්යක්ෂමව කරගෙන යාම පිණිස මෙම ත්‍රිකුණාමල චීන වරාය තෙල් ටැංකි සංකීර්ණයේ සුවිශේෂී වැදගත්කම හඳුනාගන්නා ලදී. ඒ අනුව 1963දී බ්‍රිතාන්‍ය රජයට පවුම් 250,000 ක් මුදලින් ගෙවා එහි සමස්ත පාලනය සහ කළමනාකරණය ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට පවරාගෙන තිබේ. මෙම පවරා ගැනීමත් සමගම එය ශ්‍රී ලංකාව සතු ජාතික සම්පතක් බවට පත්වේ.

## ඉන්දියානු තෙල් සමාගම සහ තෙල් ටැංකි

2002 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිසංස්කරණය කිරීමේදී මෙම තෙල් ටැංකි සංකීර්ණය ඉන්දියානු තෙල් සමාගමට බදු දීමට එවකට එජාප ආණ්ඩුව විසින් තීරණය කරන ලදී. එම ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව එක ටැංකියකට ඇ.ඩො. 1000 බැගින් ටැංකි 99 සඳහා වාර්ෂිකව ඩොලර් 99,000 ක ගාස්තුවක් මහා භාණ්ඩාගාරයට ගෙවන ලදී. ඊට අමතරව ඇ.ඩොලර් 1000ක මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවන ලදී. එසේ වුවද ගිවිසුම අත්සන් කරනු ලබන මොහොතේදී භූමියේ අයිතිය සම්බන්ධව නීතිමය ප්‍රශ්නය පැන නැගිණි. ගැටලුව නම් එදා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පවුම් 250,000 ක මුදලක් ගෙවා ඉඩම සහ ටැංකි සංකීර්ණය නිදහස් කරගනු ලැබුවද එය පැවරුණේ ශ්‍රී ලංකා රජය භාරයටය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පවරාගැනීමක් සිදු වූයේ නැත. ඒ අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉන්දියානු තෙල් සමාගම වෙත බදු දීම සඳහා අයිතියක් නොවීය. මේ හේතුවෙන් ගිවිසුම්ගත දින සිට මාස 06ක් ඇතුළත ශ්‍රී ලංකා රජය සතු ත්‍රිකුණාමලය ටැංකි සංකීර්ණය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත පවරාගෙන එතැන් සිට වසර 35ක කාල සීමාවක් සඳහා බදු ගිවිසුම ක්‍රියාත්මක විය යුතු බවට කොන්දේසියක් ඇතුලත් විය.


කෙසේ නමුත් මෙම ගිවිසුම අත්සන් කර මාස කිහිපයකින් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාව සිටි ආණ්ඩුව වෙනස් වූයෙන් ගිවිසුමේ ප්‍රධාන කොන්දේසිය ක්‍රියාත්මක නොවීය. ඒ අනුව අත්සන් කළ දින සිට මාස 06කින් ගිවිසුම අක්‍රිය විය යුතුය. නමුත් ලංකා ඉන්දියානු තෙල් සමාගම දිගටම තෙල් ටැංකි පරිහරණය කරමින් රැඳී සිටියේය. ගිවිසුම අක්‍රීය වී පවතිද්දී මේ අත්පත් කරගෙන සිටීම ප්‍රශ්නකාරී වූ නමුත් දිගටම ගාස්තු ගෙවන ලදී. ගිවිසුම අක්‍රිය වී තිබියදී ගාස්තු ලබාදීමද ගැටලුවක් විය. ලංකා ඉන්දියානු තෙල් සමාගමටත් ඉන්දියානු රජයටත් එකී ගිවිසුමේ පවතින නෛතික ගැටලුව විසඳාගත යුතු වූ අතර විවිධ අවස්ථාවලදී ඉන්දියානු තෙල් සමාගම සහ ඉන්දියානු රජය මෙම ගැටලුව විසඳාගැනීමට මැදිහත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2017 වර්ෂයේදී තෙල් ටැංකි ප්‍රමාණයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවටත්, ප්‍රමාණයක් ලංකා ඉන්දියානු තෙල් සමාගමටත්, දෙපාර්ශවය විසින් ඉතිරිය එම සමාගමටත් පැවරීම් කිරීමට යෝජනාවක් ඉදිරිපත් විය. මෙයට වෘත්තීය සමිති මට්ටමින් දැඩි විරෝධයක් එල්ල වූ අතර තෙල් බෙදාහැරීම් අඩපණ කොට තෙල් වැඩවර්ජනයක්ද දීපව්‍යාප්තවද ක්‍රියාත්මක විය. ඒ මොහොතේදී තාවකාලික එම ක්‍රියාවලිය ආපසු හැරවීමට හැකිවිය. එනමුදු 2002 වර්ෂයේ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුකාල සීමාවෙන් ඇරඹි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රතිව්‍යුවහගත කිරීමේ වැඩපිළිවෙළ තුළ ක්‍රමානුකූලව ඛනිජ තෙල් ඒකාධිකාරියෙන් රජය බැහැරවීම සහ බහුජාතික සමාගම් වෙත පැවරීමේ ක්‍රියාවලිය එතැන් සිට පැවති සියලු ආණ්ඩු විසින් ක්‍රමානුකූලව ඉදිරියට ගෙන එමින් තිබේ.

## බල අරමුණු සහ තෙල් ටැංකි

1924 බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීහු තම පාලනය තුළ යුදමය වශයෙන් වරාය ආශ්‍රිත ප්‍රදේශයේ වටිනාකම ඉතා හොඳින් අවබෝධගෙන සිටියහ. ක්‍රමානුකූලව ලෝකයේ ඛනිජමය වුවමනාවන් වෙනුවෙන් භාණ්ඩ ප්‍රවාහනය, හුවමාරුව, ප්‍රති නිෂ්පාදනය සීඝ්‍රලෙස දියුණුවට පත්වෙද්දී ශ්‍රී ලංකාවේ ප්‍රමාණාත්මකව විශාල වූ මුහුදු සීමාව තුළ මෙම නාවික

11 වැනි පිටුවට

> 2002 වර්ෂයේ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුකාල සීමාවෙන් ඇරඹි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රතිව්‍යුවහගත කිරීමේ වැඩපිළිවෙළ තුළ ක්‍රමානුකූලව ඛනිජ තෙල් ඒකාධිකාරියෙන් රජය බැහැරවීම සහ බහුජාතික සමාගම් වෙත පැවරීමේ ක්‍රියාවලිය එතැන් සිට පැවති සියලු ආණ්ඩු විසින් ක්‍රමානුකූලව ඉදිරියට ගෙන එමින් තිබේ.



"ජීවිතයට ප්‍රශ්න එන්නේ ඔබ විනාශ කිරීමට නොවේ. ඔබ තුළ සැඟවුණු ශක්තීන් සොයා ගැනීමට ඔබට උදව් කිරීමටය."

**අබ්දුල් කලාම්**

# ආතතියද? වෙනස් කරමුද?



වර්තමාන සමාජයේ මානසික ආතතිය යන වචනය බහුලව අසන්නට ලැබෙනවා. කා සමග කතා බහ කළත් කාටත් මෙය පොදු දෙයක් බවට පත්වෙලා. මානසික ආතතිය ඇති වීමට නිශ්චිත හේතුවක් හෝ හේතු හඳුනා ගැනීමට අපහසු වන අතර එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන බවද වෛද්‍ය විද්‍යාත්මක මතයයි. නමුත් ඇතැම් සුලබ හේතු බොහෝ ප්‍රමාණයක් මානසික ආතතියට බලපාන බව වෛද්‍යවරුන් පවසනවා. ඒ අතර ආර්ථික ගැටලු මෙන්ම එයින් මතුවන සමාජීය ගැටලු ප්‍රබල හේතුවක්.

ලංකාවේ පවතින ආර්ථික වටපිටාව නිසා බොහෝ දෙනෙක් මානසික ආතතියෙන් පසුවෙන බව නොරහසක්. මේ පිරිසෙන් බහුතරය කාන්තාවන් වන්නේ නිවසේ ආර්ථිකය මෙහෙයවන සියලු කටයුතු කළමනාකරණය කරන්නී ඔවුන් වීමයි. මේ ලෙස මානසික ආතතිය ඇතිවන ආර්ථික ගැටලු ගණනාවක් වර්තමානය වන විට දක්නට ලැබෙනවා. එයින් ප්‍රධානතම හේතුවක් වන්නේ අධික ලෙස බඩු මිල ඉහළ යාමයි. සමහර භාණ්ඩවලට ඇති මිල පාලනයෙන් තොරවීම නිසා දිනෙන් දින බඩු මිල ඉහළ යනවා. හම්බ කරන මුදල ජීවත් වෙන්න ප්‍රමාණවත් නැහැ. අඩුම තරමින් පවුලේ මාසික ආහාර අවශ්‍යතාව (පෝෂණය නොසලකා හැර) සපුරා ගන්නත් ප්‍රමාණවත් නැහැ. මේ බර වැඩිපුරම දැනෙන්නේ පවුලක කාන්තාවන්ට. අද කෑවොත් හෙට කන්නෙ කොහොමද කියලා දෙගිඩියාවෙන් ජීවත් වෙන කාන්තාවන්ට ආතතිය හැදෙන එක පුදුමයක් නොවෙයි. හාල් කීයද? පොල් කීයද? ළඟදී ලූණු කෑවද කියලා අහන්න කෙනෙක් නැති වුණාට ගෘහණියකගේ ජීවිතවල පීඩනයක් මිස සැපක් කොයින්ද?

බඩු මිල ඉහළ ගිහින් විතරක් නොවෙයි, බඩු හිඟතාවය ඒවා ගන්න පෝළිම්වල පැය ගණන් රස්තියාදු වෙන්න වුණාම දැනෙන පීඩාව ,එහෙම රස්තියාදු වෙලා ගෑස් නැතිව, කිරිපිටි නැතිව හිස් අතින් එන්න වුණාම දැනෙන හැඟීම වචනවලින් විස්තර කරන්න බෑ. පෝළිමේ ඉඳලා හරි ගෑස් එක ගෙනාවම ඇවිලෙන්නේ ලිපේ ගින්දර විතරක් නොවෙයි. කොයි වෙලාවෙ ගෑස් එක පුපුරයි ද කියල කාන්තාවන්ගෙ හිතේ ගින්දරත් ඇවිලෙනවා.

ඒ ඔක්කොම කරදර මැද්දෙ පැයක් හෝ දෙකක් විදුලිය විසන්ධි කරනවා පාඩම් කරන දරුවො ඉන්න, කඩඉම් විභාගවලට පෙනී ඉන්න දරුවෝ ඉන්න අම්මලාට මේක මහා වදයක්. ගෙදර දොරේ වැඩ ටික කර ගන්නත් වෙලාවට කෑම බීම හදාගන්නත් මේ නිසා බැරි වෙනවා. මේකත් කාන්තාවන්ට දරා ගන්න බැරි පීඩනයක් අතරේ තවත් එක් ආතතියක්.

කොරෝනා වසංගතය තුළ මතුවන සෞඛ්‍ය ගැටලු මෙන්ම වෙනත් සාමාජීය ගැටලු නිරාකරණය කිරීම සඳහා සඳහාත් පාලකයන්ට නිසි වැඩ පිළිවෙලක් නොතිබීම හේතුවෙන් කාන්තාවන් මත පීඩනය තීව්‍ර වුණා. ඔන් ලයින් අධ්‍යාපනය ,පාසල් වසා තැබීම,පාසල් පටන් ගැනීම. දරුවන් කොටස් වශයෙන් පාසල් ගෙන්වීම. දරුවන් සියලු දෙනාම එකවර පාසල් ගෙන්වීමත් ආදී කරුණු නිසා කොයි වෙලාවෙ හෝ තමන්ගේ දරුවන් කොවිඩ් වසංගතයේ ගොදුරක් වේවිද කියන බය අම්මලා හැමෝටම තියෙනවා. මේ නිසාම තවමත් දරුවෝ පාසල් නොයවපු අම්මලත් ඉන්නවා. මේ අම්මලා තමන්ගේ දරුවගේ අධ්‍යාපනයේ හෙට දවස ගැන ඉන්නේ බියකින්. ආතතියකින්.

අනෙක් අතට පොහොර ප්‍රශ්නය නිසා ගොවි කාන්තාවන්ගේ පීඩනයන් සුළුවෙන් සලකන්න බැහැ. ඒ වගේම කුකුල් කූඩු වගේ බෝඩින් කාමරවල ඉඳගෙන භූමි තෙල් හෝ ගෑස් ලිපෙන් උයාගෙන කන වෙළඳ කලාපවල සේවය කරන සේවිකාන්ගෙ පීඩනයත් සුළු පටු නැහැ. තේ දළු නෙළන කාන්තාවන්ගේ තත්වයත් ඉතාම ඛේදනීයයි.

මානසික ආතතිය නිසා විවිධ සංකූලතා ඇති විය හැකි බව වෛද්‍යවරුන් පවසනවා. අධික රුධිර පීඩනය, අංශ භාගය, හදවත් රෝග දියවැඩියාව, ගැස්ට්‍රයිටීස්, නින්ද නොයෑම, විශාදය, (Depression) ප්‍රතිශක්තිය අඩුවීම, අසාමාන්‍ය බිය වැනි සංකූලතා මේ අතර ප්‍රධාන තැනක් ගන්නවා. මේ තත්වය හරියට කබලෙන් ලිපට වැටුණා වගේ වැඩක්. විවිධ හේතු නිසා ආතතියට පත්වෙන කාන්තාවන්ගේ අවසාන ඉරණම සදාකාලික රෝගීන් බිහිවීම පමණද?

වෛද්‍යවරු පවසන්නේ මානසික ආතතිය ඇති විට ප්‍රමාණවත් තරම් නින්දක් ලබාගන්න යනුවෙනුයි. නමුත්, ගෑස් නැතිව උයන්න විදිහක් නැති වෙනකොට, පොහොර නැතිවෙලා වගා පාළු වෙනකොට, දරුවන්ට කිරි වීදුරුවක් දෙන්න බැරි වෙනකොට, අතට ලැබෙන සොච්චමෙන් ජීවිතේ ගැටගහ ගන්නේ කොහොමද කියලා හිතනකොට සැනසිල්ලේ නිදාගන්න අම්මලාට, ගෘහණියන්ට, කාන්තාවන්ට පුළුවන්ද? හාල් ටික එළවළු ටික අහස උසට ගණන් යද්දි පාලකයෝ මර නින්දේ හිටියට ගෙදර කාන්තාවට නිදාගන්න පුළුවන්ද?

මානසික ආතතිය නැති කරන්න වෛද්‍යවරු පවසන තවත් දෙයක් තමයි ආතතිය ඇතිවන අවස්ථා මග හරවන්න හෝ වෙනස් කරන්න කියන කාරණාව. ඒ අවස්ථා මග හරවන්නනම්, රොකට් වේගයෙන් ඉහළ යන බඩු මිල අඩු කරන්න ඕන, අත්‍යවශ්‍ය භාණ්ඩ, ගෑස්, කිරි පිටි, ඉන්ධන සහ විදුලිය හිඟයකින් තොරව ලබා දෙන්න ඕන. ජීවත් වෙන්න පුළුවන් වැටුපක් ලබා දෙන්න ඕන, හැබැයි වසර 73 ක පමණ කාලයක් මෙරට මාරුවෙන් මාරුවට පාලනය කරපු පාලකයන්ගෙන් නැවත් වතාවක් මේවා බලාපොරොත්තු වෙන්න බැහැ. කිසිසේත්ම බැහැ. ඔවුනට නොහැකි බව දිනේන් දිනම තහවුරු වෙමින් තියෙනව.

එනිසා මෙවන් පසුබිමක ආර්ථික අර්බුදය පදනම් කරගනිමින් ඇති වී ඇති මානසික ආතතියට විසඳුම් සොයා ගත හැක්කේ ජනතාව පෙළන පාලන ක්‍රමය වෙනුවට ජනතාවාදී පාලනයක් ගොඩනගා ගැනීම තුළින්ම පමණයි. එවන් පාලනයක් තුළ කාන්තාව පෙළන මේ බර පොදිය සමාජය විසින් බාර ගන්නා හෙයින් ඇයට තිබෙන ආතතියද පහවයනු ඇත.



# ජනතාවාදී දේශපාලනයක් ප්‍රතිස්ථාපනය කරමු

**චම්පා සුමුදු කුමාරි සහෝදරිය**

අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය

අද වෙනකොට විශේෂයෙන්ම සහල්, කිරිපිටි, ගෑස්, එළවළු. මිල සීඝ්‍රයෙන් ඉහළ යාමත්, ගෑස්, කිරිපිටි ආදිය වෙළඳපොලේ හිඟ වීමත් මේ වන විට රටේ ප්‍රධාන ප්‍රශ්නය බවට පත් වෙලා. මේ හේතුවෙන් කාන්තාවො විදියට අපි ගොඩක් පීඩාවට පත් වෙලා ඉන්නෙ. අපි කැමති වුණත් අකමැති වුණත් ගෙදර දොරේ පරිපාලනය, විශේෂයෙන්ම මුළුතැන්ගෙය, දුවා දරුවන්ගෙ කටයුතු පැවරිල තියෙන්නෙ කාන්තාවො විදියට අපිටයි.

අනිත් පැත්තෙන් රටේ ආර්ථිකයේ කඩා වැටීමත් සමග සිදුවන සමාජීය ගැටලුවලින් වඩාත් පීඩාවට පත්වන්නෙ කාන්තාවො විදියට අපි. කුඩා ගැහැනු දරුවගෙ සිට මහලු කාන්තාව දක්වා සිදුවෙන ලිංගික අඩතේට්ටම් අද වෙනකොට ඉහළ ගිහිල්ලා. ඒ කියන්නෙ කාන්තාවකට තියා පිරිමියෙකුටවත් ජීවත් වෙන්න බැරි විදියට මේ සමාජය සෑම අතින්ම පිරිහිල ඉවරයි.

එතකොට පිරිහිච්ච මේ සමාජය වඩා හොඳ සමාජයක් බවට පත් කරන්න රටේ ජනගහනයෙන් 52%ක බහුතරයක් වූ කාන්තා අපි මොකක්ද කරන්න ඕන. මේ පිරිහුණු දේශපාලනය ක්‍රමය වෙනුවට ජනතාවාදී දේශපාලනයක් ප්‍රතිස්ථාපනය කරන්න අනිවාර්යයෙන්ම අපි පෙළගැසෙන්න ඕනෑ.

## ඈත්ත තිත්තය

තිත්ත කළුවර කුටිවල
සිරවී සිටින ගැහැනුනි
එළිය බෝ දුර නැත
බිත්තියේ සීමාව පමණකි

හිස මත බොහෝ බර ඇති
දැනුනේ සුසුමට පමණකි
දියකර හරිනු රිසි ඇති
කඳුළකට වුව ඉඩ නැති

ඈත්ත තිත්තය හැම විට
නොමැති කිසිවක් කළ හැකි
බොරුව පළවා හරිනට
තිත්ත වුව රස කළ හැකි

බර පොදිය උසුලනු හැකි
සවිමත් දෑත් වෙනුවෙන්
සුසුමක් වුවද බර ඇති
චණ්ඩ සුළඟක් කළ හැකි

## නිදහසට තවත් සීමා

ඇෆ්ගනිස්ථානයේ තලෙයිබාන් පාලනය විසින් එරට කාන්තාවන්ට සංචාරක සීමා පනවා තිබේ. ළඟම ඥාතී පිරිමියෙක් නොමැතිව ඇෆ්ගනිස්ථානයේ කාන්තාවන්ට කිලෝමීටර 72 කට වැඩි දුරක් ගමන් කිරීම තහනම් කර තිබේ. එසේම වාහන තුළ සංගීතය වාදනය කිරීමද තහනම් කර තිබේ. තලෙයිබාන් කණ්ඩායම විසින් නැවත ඇෆ්ගනිස්ථානයේ පාලනය ලබා ගත් පසු කාන්තාවන්ගේ නිදහස සහ අයිතිවාසිකම් සීමා කිරීමට දිගින් දිගටම නීති පනවන ලදි. මෙම තත්ත්වය තුළ ඇෆ්ගනිස්ථානු කාන්තාවන්ට බියෙන් ජීවත් වීමට සිදුවන තත්ත්වයක් ඇති කර ඇති අතර එම තත්ත්වයට එරෙහි වන කාන්තාවන් මර්දනය කිරීමද සිදු කරනු ලබයි. එසේම අධ්‍යාපන සහ රැකියා කිරීමේ නිදහස ඉල්ලා විරෝධතා දක්වන කාන්තාවන්ට ගම්මිරිස් කුඩු ප්‍රහාර එල්ල කිරීම වැනි නින්දිත ක්‍රියාද තලෙයිබාන් කණ්ඩායම් විසින් සිදු කරනු ලබයි.

## පොලිස් ලිංගික අඩන්තෙට්ටම්

සුඩානය තුළ ඔක්තෝම්බර් මාසයේදී ඇතිවූ හමුදා කුමන්ත්‍රණයට එරෙහි උද්ඝෝෂණ වලදී කාන්තාවන් පෙරමුණේ සිට සහභාගි වූහ. පසුගියදා පැවති එවැනි විරෝධතාවයකදී ආරක්ෂක අංශ විසින් කාන්තාවන් 13 දෙනෙකු දූෂණය කිරීමට විරුද්ධව සුඩානය පුරා සිය ගණනක් කාන්තාවන් විරෝධතා පවත්වමින් සිටී. මෙම විරෝධතාවලදී කාන්තාවන් ප්‍රකාශ කළේ ආරක්ෂක අංශයන්හි එවැනි පහත් ක්‍රියාවලින් ඔවුන් බිය කළ නොහැකි බවයි. මෙම සිදුවීම පිළිබඳව විධිමත් ස්වාධීන පරීක්ෂණයක් සිදුකරන ලෙසට ජාත්‍යන්තර සංවිධාන විසින් බල කළද සුඩානයේ පවතින වත්මන් තත්ත්වය අනුව එවැන්නක් සිදුවේ යැයි අපේක්ෂා කළ නොහැක.

## ස්පාඤ්ඤය නීති අර්ථකතන පුළුල් කරයි

යුරෝපීය රටවල් තුළ විශේෂයෙන් ප්‍රංශය සහ ස්පාඤ්ඤය ආදියෙහි කාන්තාවන් සිය සැමියා, පෙම්වතා හෝ වෙන්වූ සැමියා හෝ පෙම්වතා අතින් ඝාතනයට ලක්වීම ලිංගිකත්වය මත පදනම්ව සිදුකරන ඝාතන ලෙස හඳුන්වනු ලබයි. නමුත් මෙම අපරාධයට අදාළ අර්ථ නිරූපණය පුළුල් කිරීමට ස්පාඤ්ඤය ක්‍රියා කර ඇත. ඒ අනුව මින් ඉදිරියට කාන්තාවන් හෝ ළමයින් ඝාතනයට ලක්වීම හෝ ප්‍රචණ්ඩත්වයට ලක්වීම ලිංගිකත්වය මත පදනම් වූ අපරාධ වශයෙන් සළකා දඬුවම් කිරීමට එය සැමියා, පෙම්වතා හෝ වෙන්වූ සැමියා හෝ පෙම්වතා හෝ ඇයට සම්බන්ධතාවයක් ඇති අයෙකු විසින් සිදුකර තිබීම අනිවාර්ය නොවනු ඇත. පසුගිය සමය තුළ මෙවැනි අපරාධවලට එරෙහිව බොහෝ රටවල් තුළ අරගල ඇති වූ අතර මෙවැනි නීති පුළුල් වීමට එම අරගලවලින් විශාල පිටුබලයක් ලැබුණි.

# මිනිසුන් වෙනස් කළ නොහැකිද?

ලංකාවේ දේශපාලනය තුළ වසර 70කට වැඩි කලක් ජනතාව හැසිරී ඇත්තේ එකම ක්‍රමයකටය. ප්‍රධාන ධනපති පක්ෂ දෙක වටා එකතු වූ මෙරට ජනයා වරින් වර මාරුවෙන් මාරුවට එම පක්ෂ දෙකම බලයට පත්කර තිබේ. තමන් බලයට පත් කළ පාලකයන් තමන්ව පීඩාවට පත්කරන විට, ඉන් කලකිරීමට, කෝපයට පත්වන ජනයා ඊට බැන බැන සිට මැතිවරණයක් ළංවූ විට තමන්ගේ තර්කයන් මත, නැත්නම් තමන්ට ලැබෙන කුඩා වාසියක් මත, පැරණි පක්ෂවලටම ඡන්දය දීමට පෙළඹී තිබේ. මේ නිසා මේ මොහොතේත් අපේ සමාජයේ වෙනසක් අපේක්ෂා කරන සමහරු, මිනිසුන් වෙනස් කළ නොහැකි යයි සිතති; ජනතාව දැන් මේ පක්ෂ දෙකම එපා යැයි කීවද, ඡන්දයකදී යළි එම පක්ෂවලටම එක්විය හැකි බවත්, විශ්වාස කළ නොහැකි බවත් සිතති. මෙය මෙතෙක් අත්දැකීම් අනුව, බැලූ බැල්මට සත්‍ය සේ පෙනුණද එය සත්‍යය නොවේ.

**වෙනස්වීම නියාමයක් ලෙස**


මාක්ස්වාදී දර්ශනයට අනුවත්, පොදුවේ පිළිගත් ධර්මතාවන්ට අනුවත් මේ ලොව සියල්ල වෙනස් වේ. වෙනස් නොවන, වෙනස් කළ නොහැකි කිසිවක් නැත. එහෙත් ප්‍රශ්නය වන්නේ දේවල් හා මිනිසුන් අපට අවශ්‍ය ආකාරයට අපට අවශ්‍ය වේලාවට වෙනස් කර ගත හැකිද යන්නය. භෞතික දේවල් මෙන්ම ජනතාවද, සමාජයක්ද වෙනස් වන නමුත් ඒවා සිදුවන්නේ ඒවාටම ආවේණික ආකාරයටය. ඒවා තුළ පවතින අභ්‍යන්තර සාධකවල ක්‍රමික වර්ධනයත්, පරිසරය විසින් කරන බලපෑමත් අනුව වෙනස්කම් සිදුවන අතර අප කළ යුත්තේ එම තත්වයන් දාර්ශනිකව හා දේශපාලනිකව වටහා ගෙන කටයුතු කිරීමය.

මෙහිදී සමාජයක වෙනස්වීම, ජනතාවක් වෙනස් වීම, භෞතික වස්තූන්ගේ වෙනස් වීමට වඩා සංකීර්ණය. එය සරල ලෙස වටහා ගත නොහැක. සමාජයක වෙනස්වීමට, ජනතාවක් වෙනස් වීමට සාධක රැසක් බලපායි. මෙහිදී ඕනෑම වස්තුවක මෙන්ම ජනතාවගේ චින්තනයේ වෙනස්වීම් සිදුවන්නේ එකවර නොවේ. කාලයක් තිස්සේ ප්‍රමාණාත්මකව සිදුවන වෙනස්කම් එක්තරා අවස්ථාවකදී ගුණාත්මක පිම්මක් ලෙස විශාල වෙනසකට ලක්වේ. එබැවින් දේශපාලනයේදී මිනිසුන් වෙනස් නොවන්නේ යැයි සිතීම, හැම විටම එකම ක්‍රමයකට හැසිරේ යැයි සිතීම නිවැරදි නොවේ.

**මිනිසුන් හිතන්නේ කොහොමද?**

ඕනෑම සමාජයක ජීවත්වන ජනතාවගේ විඥානය හෙවත් ඔවුන් සිතන ආකාරය තීරණය කරන සාධක රැසක් තිබේ.

මිනිසුන් බොහෝ විට අතීත සම්ප්‍රදායන්ට අනුව සිතති. ඒ අර්ථයෙන් ගත් කළ මිනිසුන් පොදුවේ සම්ප්‍රදායිකය. අනික සිරිත් විරිත් හා චින්තනය මගින් ඔවුහු සම්ප්‍රදායන්ට බැඳ දමනු ලැබ තිබේ. එසේම මිනිසුන් පොදුවේ වෙනස්කම්වලට දක්වන්නේ අකමැත්තකි; බියකි. තමන්ට හුරු පුරුදු ජීවිතය, එය කෙතරම් කටුක වුවත්, දුෂ්කර වුවත් එක්වර නොදන්නා ක්‍රමයකින් වෙනස් කර ගැනීමට ඔවුහු මැළිවෙති.



සමස්ත මානව ඉතිහාසයම අපට උගන්වන පාඩම එය නොවේද? සමාජයේ විශේෂ පුද්ගලයන්, සමාජයේ ප්‍රගමනයට අත්‍යවශ්‍ය අලුත් මතයන් ඉදිරිපත් කළ විට, අලුත් සොයා ගැනීමක් කළ විට, එය කොතරම් නිවැරදි වුවත්, කොතරම් වටිනා දෙයක් වුවත් පොදු ජනයා ඒවා එකවර පිළිගන්නේ නැත. 'මිනිසා බිහිවූයේ සත්ව පරිණාමයේ එක්තරා අවස්ථාවකදීය' යන පරිණාමවාදය තවමත් පිළිනොගන්නා මිනිස්සු ලොව සිටිති. එසේම පෘථිවිය පැතලි වස්තුවක් නොව එය ගෝලාකාර බවටත් පෘථිවිය සූර්යයා වටා භ්‍රමණය වන බවටත් ඉදිරිපත්වූ මතය එය ඉදිරිපත් වූ මොහොතේ සමාජය පිළිගත්තේ නැත. එය පැරණි මතවලට, ආගමික මතයට පටහැණි වීම නිසා අත්වූ කලබගෑනිය කොතරම්ද කිව නොහැක. එම මතය ඉදිරිපත් කළ ගැලීලියෝට එය ප්‍රසිද්ධියේ ඉල්ලා අස්කර ගැනීමට බලකරන ලදී. එසේම එම මතය ඉදිරිපත් කළ බෲනෝ පුළුස්සා මරණ ලදී. ඒ එම විප්ලවකාරී මතය පල්ලියේ සම්ප්‍රදායික ඉගැන්වීම්වලට ප්‍රතිවිරුද්ධ වූ නිසාය. එහෙත් අවසානයේ එම මත ලෝකය තුළ පිළිගැනිණි. එහෙත් ඊට විශාල කාලයක් ගත විය.

**සමාජයක දේශපාලන වෙනසක් සඳහා මුලින්ම වෙනස් වන්නේ එම සමාජයේ සිටින සංවේදී හා සවිඥානකම කොටසය. එය ආරම්භයේදී ප්‍රමාණයෙන් කුඩාය. එලෙස සමාජයේ සවිඥානික, අවබෝධය සහිත අය වෙනස්වී එම වෙනස සඳහා ජනතාවට ආරාධනා කළද, කරුණු පැහැදිලි කළද, පොදු ජනතාව එක්වර වෙනස් වන්නේ නැත. ඔවුහු පැරණි මතවාද තුළ සිටිමින් මුලින්ම ඒ දෙස සැකයෙන් බලති; එය ප්‍රතික්ෂේප කරති. එහෙත් එම නව දේශපාලන මතය වෙනුවෙන් පෙනී සිටින අය තම උත්සාහය අත්නොහැර දිගටම තම අරගලය කරන විට පොදු ජනයා ඊට ටිකෙන් ටික ප්‍රතිචාර දක්වති.**

සත්‍යය වෙත ජනතාව පිය නඟන්නේ එසේය. ඔවුන් පැරණි සම්ප්‍රදායික මතවලට බැඳී සිටින අතර, ඒවා එක්වර, වහාම බිඳ දැමීමට ජනතාව කැමති නැත. ඒ ජනතාවගේ ස්වභාවයයි.

**පාලක පංතියේ බලපෑම**

මිනිස් චින්තනයේ වෙනස් වීම මන්දගාමී කිරීමට සෑම යුගයකම පාලක පංතිය හා ඔවුන්ගේ මතවාදයන්ද බලපා තිබේ. මෙය අදටද වලංගුය. පාලක පංතීන් ජනතාව පාලනය කරන්නේ හමුදා, පොලීසි වැනි බලහත්කාරී ආයතන මගින් හෝ නිල පරිපාලන ව්‍යුහයක් මගින් පමණක්ම නොවේ. ඒ සඳහා ඔවුහු සමාජ විඥානය හැසිරවීමේ මතවාද මගින්ද ජනතාව පාලනය කරති. ඕනෑම සමාජයක ප්‍රබලව පවතින්නේ පාලක පංතියේ පංති මතවාදයන් බව අපි දනිමු. එම මතවාදය මිනිසුන්ට 'අලුත්' වීමට, අලුතින් සිතීමට වෙනස් වීමට බාධා කරයි. එය හැම විටම පවතින තත්වය සාධාරණය කරමින් එය පිළිග නිමින් ඒ තුළම ජීවත්වීමට බලකරයි. කරදර මැද ජීවත්වන මිනිසාට වෙනස්වීම්ද කරදරයක් සේ අඟවා ඔවුන් වෙනස්වීමෙන් වළක්වයි.

මේ සඳහා අදාළ යුගයේ අධ්‍යාපනය, ජනශ්‍රැතිය, මතවාද, සම්ප්‍රදායන් ආදිය පාලක පංතිය සියුම්ව යොදා ගනී. ලංකාවේද මෙය අපට දැකිය හැක. "ඕව කරන්න පුළුවන් දේවල්ද", "කවුරු ආවත් ඔහොම තමයි", "අපි හම්බ කළොත් අපි කනවා" වැනි ජනප්‍රිය මතයන් මගින් නිරූපණය කරන්නේ එම බලපෑමයි.

එබැවින් අතීත සම්ප්‍රදායන්ගෙන් බැඳුණු, පැරණි පුරුද්දේ බලය විසින් පාලනය කරනු ලබන, ජීවිතයේ මෙතෙක් සිදුවූ හැම වෙනසක්ම තවත් අලුත් කරදරයක් ලෙස දැණුන, පාලක පන්තියේ මතවාද විසින් දැඩි ලෙස පාලනය කරනු ලබන මිනිසාට එම බැඳීම් බිඳ දමා වෙනස් වීම පහසු නැත. සමාජයක් ලෙස සමාජ විඥානයන් තුළ වෙනස්වීම පහසු නැත. එහෙත් ඉන් අදහස් කරන්නේ මිනිසුන්, සමාජය වෙනස් නොවේය යන්න නොව, එය වෙනස් වන්නේ විශේෂ තත්වයන් තුළ බවය.

**වෙනස සිදුවන හැටි**

සෑම භෞතික වස්තූන් මෙන්ම සමාජයද, එහි ජනයාද වෙනස් වන්නේ එකවරම එක රැයකින් නොවේ. අප කලින්ද සඳහන් කළ පරිදි එය සිදුවන්නේ ප්‍රමාණාත්මක වෙනස්කම් ගුණාත්මක තලයට පැමිණීමක් ලෙසය. සමාජයක මිනිසුන් දේශපාලනික වශයෙන් වෙනස් වන්නේ පවතින ක්‍රමය තුළ ඔවුන් ලක්වන පීඩනය තවදුරටත් දරා ගැනීමට නොහැකි වූ විට හා තම අතීත අත්දැකීම් අනුව පැරණි පාලන ක්‍රමය තවදුරටත් පිළිගැනීමට නොහැකි වූ විටය. මේ සඳහා ජනතාවට අප පැහැදිලි කරන දේශපාලන කරුණුවලට වඩා ඔවුන් සිය ජීවිතයෙන් ලබන අත්දැකීම ප්‍රබල වේ.

සමාජයක දේශපාලන වෙනසක් සඳහා මුලින්ම වෙනස් වන්නේ එම සමාජයේ සිටින සංවේදී හා සවිඥානකම කොටසය. එය ආරම්භයේදී ප්‍රමාණයෙන් කුඩාය. එලෙස සමාජයේ සවිඥානික, අවබෝධය සහිත අය වෙනස්වී එම වෙනස සඳහා ජනතාවට ආරාධනා කළද, කරුණු පැහැදිලි කළද, පොදු ජනතාව එක්වර වෙනස් වන්නේ නැත. ඔවුහු පැරණි මතවාද තුළ සිටිමින් මුලින්ම ඒ දෙස සැකයෙන් බලති; එය ප්‍රතික්ෂේප කරති. එහෙත් එම නව දේශපාලන මතය වෙනුවෙන් පෙනී සිටින අය තම උත්සාහය අත්නොහැර දිගටම තම අරගලය කරන විට පොදු ජනයා ඊට ටිකෙන් ටික ප්‍රතිචාර දක්වති. ජනතාව තුළ අභ්‍යන්තරයේ කුඩා කුඩා වෙනස්කම් සිදුවෙයි. ඒ අතර ඔවුන් පවතින පාලන ක්‍රමය තුළ අඛණ්ඩවම පීඩාවටද පත්වෙති. එලෙස දිගින් දිගට ජනතාව අත්විඳින දරාගත නොහැකි පීඩාව එහි උච්චතම අවස්ථාවට එළඹීමත් තමන්ට අලුත් දේශපාලනයක් වෙනුවෙන් මඟපෙන්වන අයගේ අවංක මැදිහත්වීමත් එක්වූ විට එක් මොහොතකදී ජනතාව තනි තනිව නොව සමාජයක් ලෙස සමූහයක් ලෙස වෙනස් වී නව සමාජයක් වෙනුවෙන් පෙරට එති.

සමාජයේ සාමාන්‍ය කාලවලදීද මිනිස්සු වෙනස් වෙති. ඒ සමූහ ලෙස නොව තනි තනි පුද්ගලයන් ලෙසය. දේශපාලනයට සවිඥානික, දේශපාලනයේ සත්‍යයන් අවබෝධ කර ගන්නා අය තනි තනිවද වෙනස් වෙති. එහෙත් මිනිසුන් සමාජයක් ලෙස සමූහයක් ලෙස වෙනස් වන්නේ විශේෂ දේශපාලන වටපිටාවක් තුළදීය. තනි තනි මිනිසා තුළට ඔහුගේ විඥානයට නව මතවාද ඇතුළුවනවා මෙන්ම පොදුවේ ජනතාව තුළටද සමාජ විඥානයටද නව මතවාද ඇතුළත් වේ. එවිට එය සමාජ බලයක් බවට පත්වේ. දැන් අප ලංකවේ දකින්නේ ඊට ආසන්න තත්වයකි.

ලොව පුරා සමාජ පරිවර්තන සිදුවූ රටවල පොදු අත්දැකීමද එය වේ. එබැවින් මේ මොහොතේ අපේ රටේ ජනතාව වේගයෙන් වෙනස් වෙමින් සිටීම අප තේරුම් ගත යුත්තේ දේශපාලනයේ ගුණාත්මක තත්වයක් ලෙසය. සමාජය වෙනස්වීමට පටන්ගත් විට වාම දේශපාලන ක්‍රියාමාර්ගයන්ද ඊට අනුව වෙනස් විය යුතුය. ජනතාව වෙනස් වන බවත් එය සිදුවන්නේ අපේ කැමැත්තටම නොව සමාජ, දේශපාලන, ආර්ථික සාධක අනුව බවත් වටහා ගනිමින් නව වෙනසට මඟපෙන්විය යුතුය. සියල්ල වෙනස් වන ලෝකයේ ධනවාදයට මෙන්ම ඒ තුළ ජනතාවටද වෙනස් නොවී සදාකාලිකව පැවතිය නොහැක. සත්‍යය එයයි.



"ජනතාව මෙම පාඩම ඉක්මණින් ග්‍රහණය කරතිද, නැතහොත්, ඔවුහු කොතරම් ඉක්මණින් එය ක්‍රියාත්මක කරතිද යන්න අපි නොදනිමු. නමුත් මෙම පාඩමට අමතරව නොවිසඳිය හැකි අවුලෙන් මිදීමේ වෙනත් මඟක් නොමැති බවත්, ප්‍රතිවිප්ලවවාදීන් දැක්විය හැකි චපලකම් හෝ ම්ලේච්ඡකම්වලින් හෝ කිසිම සෙතක් නොවන බවත් අපි මැනවින් දන්නෙමු.

පොදු ජනතාව තමන්ගේ නායකයා වන නිර්ධන පංතිය කෙරෙහි විශ්වාසය තැබීම හැර වෙනත් ගැලවීමේ මඟක් නොමැත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05 වෙළුම, 158 පිටුව**

# පොලිටිකල් පංතිය

පොලිටික්ක අහම්බෙන් දවසක වෙනව වගේ කුකුළා අතේ අරන් පංතියට ඇවිත් පුටුවෙ ඉඳගෙන කිරනව. මැච් එකකට සෙට් වෙන්න කියල උදෙන්ම ආපු ළමයින්ගෙ හිත් කඩා වැටුණා. දොර ගාවදි සද්දෙ වහල කට්ටිය එකා එකා ඇවිත් ඉඳගත්ත, පොලිටික්කගෙ දහැන බිඳෙන්නෙ නැති වෙන්න.

"බලන්නකො ඔය ළමයි හොරෙන්ම ඇවිල්ල. මම දන්නෙත් නෑ " ටික වෙලාවකට පස්සෙ ගැස්සිලා ඔළුව කෙලින් කරපු පොලිටික්ක කිවුවෙ ළමයි වැරැද්දක් කළා වගෙ.

"අනේ... ගුඩ් මෝනිං සර්... වෙරි ගුඩ් මෝනිං... " වසන්තියයි අනුරුද්දියයි පොලිටික්ක කියල ඉවරවෙන්නත් කලින් කන් පාත් කරල වැරැද්ද බාර ගත්ත.

"අපි හොරෙන් ආවෙ නෑ සර්... සර්ගෙ ඇස් දෙකම ඉස්සරහින් ඇවිත් වාඩි වුණේ. ඒවා ඇරිලා තිබුණද නැද්ද කියන්නනම් අපි දන්නෙ නෑ" මංජුව ගේම ඉල්ලුව.

"ඔව් සර්... අපි හිතුව සර් මොනව හරි මෙනෙහි කරනව කියල. අපි කෑගහල ඒකට බාධා වුණොත්...අපරාදෙනෙ" කනියගෙනුත් පැහැදිලි කිරීමක්.

"අපි සර් කොහොමත් පංතියට එන්නෙ එහෙම තමයි. කිසිම සද්දයක් නෑ. කාටවත් කරදරයක් නෑ. ඇවිල්ල ඉඳගෙන බෝ පැළ වගේ වගේ ඉන්නව." චමිය කකුල් දෙක එකට හේත්තු වෙන්න පුටුවෙ වාඩිවුණා. "අපි උදේහවා ඇල් වතුරත් නිවල බොන්නෙ" චමියගෙ කතාවට පංතියටම හිනා පැන්න.

"මොකට කියනවද? මම දන්නවනෙ... අපේ ළමයි ගැන" පොලිටික්කත් හිනා වෙලා ඇස් දෙක පිහදාගත්තෙ වැඩේ ඇදන් ගියොත් තමන්ටත් කැරකෙන බව දැනගෙන. "ඒක නෙමෙයි. ඔය ළමයි දැක්කද දැන් කාබනික වගාව සරුවෙලා. මේ සැරේ අස්වැන්න වැඩිවෙලා කියල කියන්නෙ"

"සර් අඩ නින්දෙ හීනයක්ද කොහෙද දැකල" පස්සෙ පේලියකින් කවුරු හරි කිවුව කතාවට හිනා පොකුරු කීපයක් හැදුණා.

"මොකද්ද ළමයිනේ කියන්නෙ. මට ඇහුණෙ නෑ..." පොලිටික්ක දකුණු කන් පෙත්ත ඉස්සරහට නැමුව.

"සර්... කොල්ලො හීනෙන්ද කියල අහනව" මංජුව මංනම් නෙමෙයි කියන්න වගේ සාක්කි දුන්න.

"හීනෙන් නෙමෙයි ළමයිනේ... හැබැහින්. අර මහින්දානන්ද ඇමතිතුමා කියන්නෙ. එයා යන යන තැන එයාල දීපු කාබනික පෝර දාපු කුඹුරු සාරයි කියලා. වාර්තා ගත අස්වැන්නක්ලු" පොලිටික්කගෙ කට කනේ.

"අපරාදෙ මහින්දානන්ද මහත්තයාව ලංකාව වටේම අරන් ගියානම් කන්න දෙක තුනක අස්වැන්න රටෙන්ම එකපාර ගන්න තිබුණ" කනියටත් මොළ හතට එකක් විතරයි අඩු වගේ.

"මහින්දානන්ද ඇමතිතුමා යන්න ඕනෙ නෑ. ගොවියො කම්මැලි නැතුව වෙලට බැස්සනං හොඳ අස්වැන්නක් ගන්න තිබුණ" පොලිටික්ක කිවුවෙ පහුගිය කාලෙ බැසිල් කියපු වට්ටක්ක ගොවියො මතක් කරගෙන.

"අස්වැන්න සරුනම් බන්දුල ඇමතිතුමා මේ හාල් ගෙන්නන්නෙ මහින්දානන්ද ඇමතිතුමාව අන්නන්නද?" කනිය අහස පොළොව ගැටලනව තේරුම් ගන්න.

"දැන් එතකොට ගොයං ගහ කුරු වෙලා කරල පුංචි වුණේ ගොවියො කම්මැලි හින්ද... එතකොට ගොවියො කම්මැලිකමට වී වැපුරුවෙ නියරවල් උඩ ඉඳගෙන කියලද සර් කියන්නෙ?" මංජුව මහවැලි මහ ගොවියට ඇන්දා.

"ගොවියො කම්මැලි නෑ සර්... දැන් ගොවියො කම්මැලි නැතිව බලාගෙන ඉන්නව ඇමතිතුමාලට සලකන්න... මං හිතන්නෙ කලින් කම්මැලි අයත් ඉස්සරහට කම්මැලි වෙන එකක් නෑ" සමන එහෙම කියන අතරෙ අභිනයෙන් බෙල්ලෙ ගැටයක් ගහනව පෙන්නුව. පොලිටික්කගෙ ඔළුවට ගියේ ගොවියො ඇමතිතුමාට ටයි එකක් ගැටගහන්න ඉන්න බවක්...

"ඔය කිවුවට බඩුමිලත් අඩුයි නේද ළමයිනේ. දැන් බිත්තරත් අඩුයිනෙ" පොලිටික්ක ජාමෙ බේරගන්න වීවලින් බිත්තරවලට මාරු වෙන්න බැලුව.

"පහල වෙලේ කිරළි අඬනකොටත් බිත්තර අඩුවෙලාද දන්නෑ කියල තාත්ත කිවුව" කනියට මතක් වුණේ අමරය හොරකම් කරන බිත්තර.

"සර් කියන එක හරි වෙන්න ඇති. ඒ හින්දනෙ රැස්වීම්වලටත් ගහන්න බිත්තර අරන් එන්නෙ" මංජුව බිත්තර ගාඩ්ලගෙ නාටකේ රඟපාලම පෙන්නුව.

"බලන්න සර් විලි ලැජ්ජයි. කුජීතයි... සර්ලගෙ සර්ගෙ යාළුවට ජව්පෙට බිත්තර ගස්සවන්නත් තමන්ගෙම ගාඩ් එකෙන් කට්ටිය එවන්න වුණා කියන්නෙ මොන තරම් බංකොලොත්කමක්ද? ඔය වගේ වැඩවලින් මිනිස්සුන්ට සර්ලගෙ සර්ව එපාම වෙනව" සමන කියන අතරෙ පොලිටික්ක නෑහුණා වගේ හුණු කැටෙත් අරන් කළුලෑල්ල පැත්තට හැරුණා.




# විකාර සිහින පෙනීම හා දැකීම

නැකැත්කරුවෙක් එක්තරා රාත්‍රියක නිවසෙන් පිටතට ගොස් අහසේ තරු බලමින් ඇවිද ගියේය. කළුවරේ ගිය ඔහු හදිසියේම ළිඳකට වැටුණි. ඔහු විලාප දෙන්නට පටන් ගත්තේය. එතැනින් යන්න ගිය මිනිසෙකුට ඒ විලාපය ඇසී බැලූ විට සිදුව ඇති දෙය ඔහු තේරුම් ගත්තේය. "මිනිහො පොළොවෙ තිබෙන දේවල්වත් නොපෙනෙන කල උඩ අහසේ තිබෙන දේවල් බලන්න නේද හැදුවේ" කියා අර මිනිසා නැකැත්කරුවාට බැණ වදිමින් එතැනින් යන්නට ගියේය. (ඊසොප්ගේ උපමා කතාවකි.)

මේ කතාව බැලූ විට අපට සිහියට නැගුණේ අපේ රටේ විපක්ෂ නායකවරයාය. ඔහු දැන් සෑහෙන කලක් තිස්සේ රටේ ජනාධිපතිවරයා වීමේ සිහින දකිමින් විවිධ හාස්‍යජනක දේවල් කරමින් සිටී. වරෙක ඔහු කෙසෙල් කොටුවකට ගොස් කෙසෙල් ගොවියෙකුට කෙසෙල් මලක් කපා දෙයි. වරෙක ගමන් කිරීමට පාරක් තිබෙද්දීත් ඒ දණ්ඩක ගොස් වරිගය නසා ගනී. වරෙක කුඩයක් තිබියදී වැස්සට තෙමෙයි. මේ ළඟකදී ඔහු ජාතික ජන බලවේගයේ නායකයන්ට වක්‍රව අභියෝග කරමින් කියා තිබුණේ නිකං ලස්සන කතා පවත්වන්නේ නැතිව හැකිනම් තමා සමග තරගයට ජනතා සේවය සඳහා එන ලෙසයි. මෙවැනි පිස්සු විකාර මෝඩ කතාවක් වත්මන් ලොව කිසිදු දේශපාලනඥයෙකු කියා තිබෙනවා අපි නම් අසා නැත.

පිස්සු තරුණයා දුටු විකාර සිහිනය සිහි ගන්වන මෙබඳු පුද්ගලයින්ට රට භාරදීමට කිසිවෙකු හෝ කල්පනා කරයි නම් රෝග ලක්ෂණ තීව්‍ර වීමට පෙර මොළය පරීක්ෂා කර ගැනීම යෝග්‍යය.



# මෝඩ යකාගේ හොරකම!



අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂගේ පෞද්ගලික බැංකු ගිණුමකින් රුපියල් කෝටි 3.5ක මුදලක් (මෙය කෝටි 5.7ක් බවද කියවේ) වරින් වර හොරාට ලබාගත් ඔහුගේ ළඟම ගෝලයෙකු ගැන ආන්දෝලනාත්මක සිද්ධියක් මේ දිනවල මාධ්‍ය තුළ උණුසුම් ලෙස වාර්තා වේ. පුදුමය වන්නේ කාලාන්තරයක් තිස්සේ මෙපමණ මුදලක් වරින් වර තම ගිණුමෙන් හොරාකන බව මහින්දට 'ටච්' නොවීමය. ඒ කියන්නේ ඒ තරමටම ඔහුගේ පෞද්ගලික ගිණුම්වල පරාසය විශාල බව නොවේද?

සමහර මාධ්‍ය වාර්තා කර තිබුණේ ඔහු ජනාධිපති වූ දින සිට වැටුප නොගෙන මේ මුදල් බැංකු ගිණුමේ ඉතිරි කර ඇති බවය. එහි තේරුම තම පඩිපතේ මුදල්වලට වෙන දෙයවත් සොයා බැලීමට තරම් මතකයක් ඔහුගේ මනසට නොනැගෙන තරමේ මහත් ධන සාගරයක ඔහු පිහිනමින් සිටින බව නොවේද? අනෙක් අතට තම වැටුපෙන් කෝටි ගණන් හොරකම් කළත් තමන්ට නොදැනෙන තරම් විශාල ධනස්කන්ධයක් ඉතිරි කරගත් ජනාධිපතිවරු කීදෙනෙකු ලොව සිටීදැයි අපි නොදනිමු. රාජපක්ෂලා මේ සැහැල්ලුවෙන් සූදු කෙළින්නේ කාගේ සල්ලිවලින්ද? අනෙක් අතට ඔවුන්ගේ ඇස් වසා පෞද්ගලික ගිණුම්වල මුදල් අතුරුදහන් වන්නේනම් රටේ ජාතික ආරක්ෂාව ගැන මේ හැත්ත බුරුත්ත පම්පෝරි ගසන්නේ රෙදි ඇඳගෙන දැයි කියා අපට නම් ප්‍රශ්නයක් පැන නගී.

නාමල් පුතා මේ සිද්ධිය බොරු බව මාධ්‍යවලට ප්‍රකාශ කර තිබුණි. ඔහු කියා තිබුණේ සාමාන්‍යයෙන් තාත්තලාගේ මුදල් හොරා කන්නේ පුතාලා බවය. රටේ අහිංසක ජනයා සූරාගෙන සුරසැප විඳින රජ පුතාලාට නම් මේවා සිම්පල් වැඩය.

# ඔටු තුන් කට්ටුව

සතුන්ගේ රැස්වීමකදී වඳුරෙක් හොඳට නැටුමක් නැටූ නිසා සියලු සත්තු ඌට ඔල්වරසන් දුන්නෝය. මෙය බලාසිටි ඔටුවෙකුට එය රිසි නොවීය. ඔටුවාට බලෙන් ගෞරව ලබාගැනීමේ කෑදර සිතක් ඇති විය. ඌද නැටීමට පටන් ගත්තේය. එහෙත් උගේ සෑම චලනයක්ම කොතරම් පිළිකුල් සහගත වීද යත් කෝපයට පත් සත්තු ඌට හොඳටම තඩි බා එතැනින් පන්නා දැමූහ. (ඊසොප්ගේ උපමා කතාවකි)

දේශපාලනයේදී ජනතාව වෙනුවෙන් ඇත්තට සටන් කරන මිනිසුන් ඉතා විරලය. එවැනි මිනිසුන් කල් ගත වී හෝ ජනතා ප්‍රසාදයට ලක්වෙමින් ඉදිරියට යන විට පාලකයන් වෙනුවෙන් කපටි, හිරිකිත නැටුම් නටන ඔටු දේශපාලුවෝ තම ස්ථානය රැකගැනීමට මෙන්ම තම ස්වාමියා ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව අතරට විත් අනේක විධ කෛරාටික නැටුම් නටති.

කෙළවර පිටියේ විදුලි බලාගාරය විකුණා දැමීමට එරෙහිව අධිකරණයට ගිය වාසු, විමල්, ගම්මන්පිල විකට




ඇමති තුන්කට්ටුවේ ව්‍යාජ දේශප්‍රේමී නැටුම බලන විට අපට සිහිවන්නේද අර ඊසොප් කියූ ඔටු නැටුමය. ඇත්ත සමාජ ව්‍යාපාරයක ඇත්ත මිනිසුන් ගෙන යන සැබෑ ජනතාවාදී සටන් ක්‍රියාමාර්ග මහින්ද තම ආධ්‍යාත්මික නායකයා යැයි කියා ගන්නා මෙම දේශපාලන ඔටුවන්ගේ බොරු ජනතාවාදී රංගනයන්ගෙන් වසා දැමිය නොහැකිය. රටේ ජනයා විසින් ඒ ගොනා විකුණා හමාරය. දැන් මේ ඔටුවන්ට ඉතිරි වී ඇත්තේ ජනතාවගෙන් 'ඉල්ලන් කෑම' පමණි.

## ධනවාදයේ අර්බුදය...

3 පිටුවෙන්..

මීට වඩා යමක් බලාපොරොත්තු විය නොහැක.

වසර ගණනාවක් දුර නොව සති දෙකක දුරක් වත් නොපෙනෙන කිසිදු විෂයයක් පිළිබඳ දැනුමක් අවබෝධයක් නැති, සිහින ලෝකවල සැරිසරන, විධායක බලයට, හමුදා බලයට විදුලිය නිපදවීමට, වී ගස්වල කරල් ඇති කිරීමට පවා හැකි යැයි සිතන පාලකයෙක් ප්‍රමුඛ පාලක නඩයකට මේ රටට ලබාදිය හැක්කේ ඇස් රතු වන විහිළු පමණක් බව දැන් පැහැදිලිය. මිනිසුන් "නිකරුනේ ගමන් යෑම වැළැක්වීම" සඳහා යළිත් තෙල් මිල වැඩිකිරීමක් ළඟදී සිදු වුවහොත් ඒ ගැන පුදුම නොවන්න. ඒ පාලකයන්ගේ හැටිය.

දැන් මේ අර්බුදය ඔඩු දුවා ඇත. මේ ක්‍රමය තුළ මෙතෙක් රට පාලනය කළ පාලක කල්ලිවල නායකයන්ට රට මේ විපතෙන් ගොඩගත නොහැක. මෙය ගොඩගත හැක්කේ විද්‍යාත්මක දැනුම සහිත අනාගත අභියෝග හඳුනන කැපකිරීම් සහිත නායකයින් සිටින පුළුල් මහජන ව්‍යාපාරයක පාලනයක් මඟින් පමණි. වර්තමාන පාලනයේ විහිළුවලට කෝපවීම වෙනුවට නව ජනතාවාදී පාලනයක් සඳහා ජනතාව පෙළගැසිය යුත්තේ මේ නිසාය.

## ආණ්ඩුවේ ප්‍රතිපත්තිය...

5 පිටුවෙන්..




ආර්ථික ප්‍රතිපත්තිය නිසා. අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය බිඳ වට්ටලා තිබෙන්නේ. 1977 කෘෂිකර්මාන්තයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 31%ක් ඉපයුවා. අද වෙනකොට උපයන්නේ 7% යි. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා පොහොර ටික නැති කළාට පස්සේ මෙය 7 % සිට 1%ට බහිනවා.

බී ළූණු, අල, ඉන්දියාවෙන්. පකිස්ථානයෙන්. එළවළු කඩේකට ගියාම ලංකාවේ අල නැහැ, බීට් පකිස්ථානයෙන් ගෙනාපුවා තිබෙන්නේ. සීනි, කිරිපිටි, රටින් ගේනවා වගේම සහල් ටිකත් ගේන්නේ ඉන්දියාවෙන්, මියන්මාරයෙන්, චීනයෙන්. මේ ගෙන්වන හාල් කාබනික හාල්ද? එක පොහොර අවුන්සයක් අපේ රටට එන්නේ නැතිව. අපි චීනෙට වන්දි ගෙවනවා කෝටි 136ක්. මෙට්‍රික් ටොන් ලක්ෂ 10ක් හාල් චීනෙන් දෙනවා කීවා. වන්දි ගෙවන සල්ලියි. නිකම් දෙන හාල් ටිකයි ගාන බලන්න. අපට නිකම් හාල් දෙන්නේ නැහැ. මේවා කාබනික හාල් නොවෙයි. නාඩු හාල් කිලෝ එක පෙරෙයිදා රු. 170යි. ඊයේ 180/යි. හාල් දවසට රුපියල් 10/කින් වැඩිවෙනවා. රටින් හාල් ගෙන්වන්නේ, අඩු මිලට ජනතාවට හාල් දෙන්න කියලා කිවුවා. රුපියල් 100/ට අඩුවෙන් හාල් දෙනවා කිවුවා. ඒත් දැන් හාල් කිලෝ එක රුපියල් 180යි. මෙය කොරෝනා ප්‍රශ්නයක්ද? මේක ආර්ථිකයේ බැරිකම පිළිබඳ ප්‍රශ්නයක්. ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ ජාතික සම්පත් විකුණන් කෑම. ණයට කෑම. හොරා කෑම.  කොරෝනා අර්බුදයක් තිබෙද්දිත්, රට ආර්ථික වශයෙන් කඩා වැටිලා තිබෙද්දිත්, ගොවියා මහ පාරට වැටිලා තිබෙද්දීත් නැනෝ නයිට්‍රජන් කුප්පියෙනුත් හොරා කෑවා.

## කලාපීය බල වුවමනාවේ...

7 පිටුවෙන්..



ගමනාගමනය සුවිශේෂී කේන්ද්‍රස්ථානය බවට පත්වීම වැළැක්විය නොහැකි බව කලාපීය බලවත්හුද අවබෝධ කරගෙන සිටිති. ඒ අනුව නාවික ගමන් මාර්ගය ඉලක්ක කොට සේවා සැපයීම් සහ භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථාන ලෙස නව වරාය ගොඩනැගීම ඉන්දියාවේ ආර්ථික සැලසුම්වල ප්‍රමුඛතම කාර්යභාරය බවට පත්ව ඇත. වෙනත් ආර්ථික බලවතුන් විසින් ත්‍රිකුණාමලය වරාය ඔවුන්ගේ ආර්ථික සහ යුදමය උපායමාර්ගයන්ට අනුව භාවිත කිරීමක් ඉන්දියාව කිසිසේත් බලාපොරොත්තු නොවේ. මෙම භූ දේශපාලන අරමුණින් ත්‍රිමලය චීන වරාය තෙල් ටැංකිවල දීර්ඝකාලීන අයිතිය තමන් යටතේ තබා ගැනීමට ඔවුනට අවශ්‍යය.

1987දී ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා මෙම තෙල් ටැංකි ඇමෙරිකාවට පැවරීමට අදාළ සාකච්ඡා ආරම්භ වෙද්දී ඉන්දියාව පාර්ශ්වයෙන් ඉන්දු ලංකා ගිවිසුම කඩිනම් කරන ලදී. ඉන්දු ලංකා ගිවිසුමේ ඇමුණුමක් ලෙස ඒ මොහොතේ ජේ.ආර්. ජයවර්ධන හා රජිව් ගාන්ධි අතර හුවමාරු වූ ලිපි ඇතුළත් කොට එවැනි ක්‍රියාමාර්ගයකට නොයා යුතු බවට සඳහන්කොට තිබීමෙන් ඉන්දියාව මේ පිළිබඳව දක්වන උනන්දුව පැහැදිලි කරයි.

### සංවර්ධන උපායමාර්ගය සහ තෙල් ටැංකි

නාවික ගමනාගමනයන් කේන්ද්‍රස්ථානය බවට පත්වන ඉන්දීය සාගරයේ ශ්‍රී ලංකා මුහුද දේශසීමාව නාවික සැපයීම්වල ඉන්ධන සැපයීම සඳහා මෙම තෙල් ටැංකි සංකීර්ණයේ සුවිශේෂී විකිණීම ඉතා වැදගත්ය. තෙල් ටැංකිවල තෙල් ගබඩා කළ හැකි තෙල් ටැංකි ලීටර් ප්‍රමාණය මත අයකිරීමක් ලබා ගනිමින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ජාත්‍යන්තර නාවික සමාගම් වෙත තෙල් සපයන්නේනම් එය විශාල විදේශ විනිමය ඉපයීමකි. එමෙන්ම නැව්වලට තෙල් සැපයීම සඳහා (Bankering) පොම්ප සහ ජැටි භාවිත කළ හැකිය. එසේම ඛනිජ තෙල් නිෂ්පාදන ලෙස හෝ බොරතෙල් දුම්රිය ඔස්සේ ප්‍රවාහනය කිරීම ලාභදායී මෙන්ම කාර්යක්ෂම ක්‍රමවේදයකි. එසේම ගාල්ල, මාතර, මුතුරාජවෙල, කොලොන්නාව, කන්කසන්තුරේ සහ මඩකලපුව දක්වා මුහුද මගින් තෙල් ප්‍රවාහනය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙසද ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය භාවිතයට ගත හැකිය.

සැබෑ ලෙසම මෙම තෙල් ටැංකි සංකීර්ණයේ අලුත්වැඩිකොට භාවිතයට ගැනීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒ ගණනයන් සිදුකර ඇත්තේ ඇමෙරිකා ඩොලර් ලෙස විදේශ විනිමය අනුවය. දෙවැනි කරුණ වන්නේ එක වර ටැංකි 99ම අලුත්වැඩියා කිරීමට ගණනය කර තිබීමය. මේ කරුණු දෙකම විශාල දුර්මත දෙකකි. මේ දුර්මත දෙක පරාජය කළ යුතුමය. අලුත්වැඩියාව සඳහා විදේශ විනිමය ලෙස විශාල වශයෙන් වැයවීමක් සිදු නොවේ. කරාම දැමීම, වැලව වර්ග සවිකිරීම, දුර්වල තහඩු ඉවත්කොට නැවත ස්ථාපිත කිරීම, සැන්ඩ් බ්ලාස්ට් කිරීම සහ උපාංග සවිකර පිංතාරු කිරීම ප්‍රධාන කාර්ය අතර වේ. මේ සඳහා ඉංජිනේරුමය සහ ශිල්පීය හැකියාව කොලොන්නාව වැඩහල, පිරිපහදු වැඩහල, පෞද්ගලික යාන්ත්‍රිය වැඩහල් මගින් මෙරටදී ලබාගත හැකිය. මෑතකදී මේ හා සමාන ධාරිතාවයක් සහිත ටැංකියක් කොලොන්නාව නිමාව තුළ අලුත්වැඩියා කර දැනට භාවිතයට ගනිමින් ඇත. මෙම ඉදිකිරීම් 2018 දී ආරම්භ කර මේ වන විට අවසන්කොට දැනට භාවිතයට ගනිමින් ඇත. එසේම මේ ආකාරයේම ටැංකි හතරක් දැනට කොලොන්නාව නිමාව තුළ ඉදිවෙමින් පවතී.

ඒ අනුව ක්‍රමානුකූලව ටැංකියෙන් ටැංකිය අලුත්වැඩියාව ආරම්භ කරමින් ප්‍රයෝජනයට ගනිමින් ව්‍යාපෘතියක් ලෙස ඉදිරියට යාමට ශ්‍රී ලංකාවට ආර්ථිකව හෝ භෞතිකව අපහසු නොවේ. කෙසේ වුවද මෙවන් ආර්ථික වශයෙන් ලාභ ඉපිදවිය හැකි තෙල් ටැංකි පද්ධතියකින් රටට ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහා එවැනි ජාතික සම්පත් සංවර්ධන සැලැස්මේ කොටසක් බවට පත් කර ගන්නා ජනතාවාදී පාලනයක් බිහිවීම අත්‍යාවශ්‍යය.

## මැතිවරණය කල් තැබීම...

12 පිටුවෙන්..

තිබෙනවා. ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී තීන්දුවට ඔබ ඔබේ විරෝධය පළ කරන්න. ඡන්දය ඉල්ලා ආණ්ඩුවට බල කරන්න. ආණ්ඩුව ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස කටයුතු කරනවා නම් අපි ජනතාවට කියන්නේ මේ ආණ්ඩුව පළවා හැරීමට කටයුතු කරන ලෙසයි. පළාත් පාලන ආයතනවලින් පමණක් නොව ඔවුන් සිංහාසනයෙන් බස්සවා අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී, සාධාරණ, යුක්තිගරුක ආණ්ඩුවක් හැදිය යුතුයි. මේ කල් තබන ලද ඡන්දය දිනා ගැනීමටත් ආණ්ඩුව මෙසේ තක්කඩි ලෙස තවදුරටත් කටයුතු කරන්නේ නම් මේ ආණ්ඩුව පරාජය කර ජනතාවගේ ආණ්ඩුවක් ගොඩනැගීමට අත්වැල් බැඳ ගන්නා ලෙස අපි ජනතාවගෙන් ඉල්ලනවා."

## ජාතික සම්පත්...

න්න දියුණු රටක් බවට පත්කරන්න ඉන්න සියලු දෙනාගෙම ප්‍රශ්නයක්. විදේශගත ශ්‍රී ලාංකිකයින් කවදා හරිමේ රටට එනවා නම් ඔවුන්ටත් අදාළ ප්‍රශ්නයක්. මේ රට බේරා ගැනීමට බලාගෙන ඉන්න සියලුම දෙනාගේ ප්‍රශ්නයක්. ආසියාවේ අභිමානයක් ඇතිව ජීවත් වෙන්න ඕනෑ රටක් නිරුවත් කරන මේ ක්‍රියාවලිය තීරණාත්මක ලෙස පරාජය කළ යුතුයි. මේ තත්වය පරාජය කරන්න එකතු වෙන්න කියලා. මේ රටට ආදරය කරන දේශප්‍රේමීන් සියලු දෙනාගෙන් අපි ඒ ඉල්ලීම කරනවා."

# බියගුලු ප්‍රහාරවලින් ජාතික ජන බලවේගයේ ගමන නවත්වන්න බැහැ

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා



දේශපාලන ප්‍රතිපත්ති පිළිබඳව සමග ගැටෙන්නට තමන් සූදානම් නමුත් නින්දිත ක්‍රියාමාර්ගවලින් ගැටෙන්නට නොඑන ලෙසට ජනාධිපතිවරයාට සහ ආණ්ඩුවට අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, නීතිවිරෝධී කණ්ඩායම්වල බියගුළු ප්‍රහාරවලින් ජාතික ජන බලවේගයේ ගමන නැවැත්වීමට නොහැකි බව ප්‍රකාශ කළේය.

විජිත හේරත් සහෝදරයා මේ බව කියා සිටියේ ජාතික ජන බලවේගයේ ගම්පහ දිස්ත්‍රික් සමුළු අවස්ථාවේ බිත්තර ප්‍රහාරයක් එල්ල කිරීමේ සිදුවීම පිටුපස දේශපාලනය පැහැදිලි කිරීම සඳහා පසුගිය 31වැනි දින ජ.විපෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් කරුණු දක්වමින් ඔහු මෙසේද පැවසීය.

"කලගෙඩිහේන පෞද්ගලික හෝටල් පරිශ්‍රයකදී ජාතික ජන බලවේගයේ ගම්පහ දිස්ත්‍රික් සමුළුව පවත්වනු ලැබුවා. සමුළුව පැවැත්වීමට විනාඩි කිහිපයකට කලින් ශාලා භූමියට ඇතුළුවන ගේට්ටුව අසලදී මැර කණ්ඩායමක් විසින් ඉතාම නිර්ලජ්ජිත ප්‍රහාරයක් දියත් කළා. ඒ වනවිට අනුර දිසානායක සහෝදරයා ඇතුළු සියලු ආරාධිතයන් ශාලාවට ඇතුල්වී අවසන් වී තිබුණා. මෙම මැර පිරිස ගේට්ටුව අසල කලබලකාරී තත්වයක් ඇතිකර ශාලාව දෙසට බිත්තරවලින් දමා ගසා තිබෙනවා. මෙම පිරිස  මෙහෙයවූ අයගේ උත්සාහය වී තිබෙන්නේ මෙය සාමාන්‍ය ජනතාවගෙන් එල්ල වූ ප්‍රහාරයක් ලෙස පෙන්වා දීමයි. පසුගිය දිනවල පිටකොටුවේදීත් මෙවැනිම සිදුවීමක් අපි දැක්කා. තෙල් ටැංකි විකිණීමට එරෙහි ගිවිසුමට එරෙහිව අප විසින් පවත්වන ලද විරෝධතා පා ගමනේදී සංවිධානාත්මක කිහිප දෙනෙක් පැමිණ මේ ආකාරයේ සිදුවීමක් ඇතිකර තිබුණා. මෙම ප්‍රහාරයට සම්බන්ධ වූ පිරිසගෙන් දෙදෙනෙක් එතැන සිටි අය විසින් අල්ලා අප වෙත බාර දී තිබුණා. ඉන්පසු ඔවුන් දෙදෙනා පොලීසියට බාරදී තිබුණා. ඔවුන් කිරීමට උත්සාහ කළ දේ ඡායාරූප සහ වීඩියෝ ගත වී තිබෙනවා. මේ සිද්ධියේදී අල්ලා ගන්නා ලද දෙදෙනා ඔවුන් ත්‍රීරෝද රථ, වෑන් රථවලින් එහි පැමිණි බව ප්‍රකාශ කර තිබෙනවා. ඔවුන්ගෙන් එක් අයෙක් මහගෙදර විජය ආරච්චිලාගේ රත්මල් අසිත කුමාර විජේරත්න. මෙතන බරපතල ගැටලුව වන්නේ ඔහු  තමන්ගේ නම වෙනස් කළ අයෙක් වීමයි. ඔහු 2010 නොවැම්බර් 30වැනිදා තමන්ගේ නම වෙනස් කර තිබෙනවා. ඔහුගේ කලින් නම ගේබ්‍රියල් රත්මල් අසිත කුමාර. ඔහු නම වෙනස් කර ඇත්තේ මෙවැනි ආකාරයේ අපරාධවලට සම්බන්ධ වී සිටීම නිසා යැයි අපට සැක කළ හැකියි. අනෙක් පුද්ගලයා ආනන්ද බණ්ඩාර. මොවුන් දෙදෙනාම පෞද්ගලික ආරක්ෂක සේවයකට සම්බන්ධ වන බව ඡායාරූපවලින් පැහැදිලි වෙනවා. ඔවුන් ඇවන්ගාඩ් ආරක්ෂක සේවයේ නිලඇඳුම් ඇඳගෙන සිටීමෙන් මේ බව තහවුරු වෙනවා. මෙම ප්‍රහාරය මෙහෙයවන ලද්දේ ඇවන්ගාඩ් ආයතනයෙන් බව ඡායාරූපවලින් සනාථ වෙනවා. එසේම ඔවුන් සිදුකරන ප්‍රකාශවලදී මේ බව පිළිගෙන තිබෙනවා. තමන් හමුදාවේ විශ්‍රාමිකයින් බවත් ඔවුන් පිළිගන්නවා.

මෙම ප්‍රහාරය සැලසුම් කර ක්‍රියාත්මක කරන්නේ ඇවන්ගාඩ් වුවමනාව මතයි. පිටකොටුවේ බිත්තර ගැසීමේ සිදුවීම පිටුපසත් සිටින්නේ ඔවුනුයි. මෙම කණ්ඩායමේ අසිත, අබේරත්න, අනිල් නිශ්සංක, සංජීව පෙරේරා, ගෝමස්, රණවීර, ප්‍රීති කුමාර, රාජකරුණා, නිරෝෂන්, රූපසිංහ, අධිකාරි, කාරියවසම්, ජයසිංහ යන අය පිටකොටුව ප්‍රහාරයට පැමිණ තිබෙනවා. කලගෙඩිහේන ප්‍රහාරයට අසිත, අබේරත්න, අනිල් නිශාන්ත, බණ්ඩාර, වසන්ත, මුණසිංහ, සම්පත්, එම්.ආර්., රූපසිංහ, ගෝමස්, අධිකාරී, ප්‍රීති කුමාර, නිරෝෂන්, චමින්ද යන අය පැමිණ තිබෙනවා. මෙම කණ්ඩායම් දෙකම මෙහෙයවා ඇත්තේ ඇවන්ගාඩ් ආයතනය විසින් බව ඉතාම පැහැදිලියි. ඇවන්ගාඩ් අධිපති නිශ්සංක සේනාධිපතියි. ඔහු ගෝඨාබය ජනාධිපතිවරයාගේ සමීපතම මිත්‍රයෙක්. ඔහු නිතර ජනාධිපතිවරයා මුණගැසෙනවා. මෙම ප්‍රහාරයන් දෙකම දේශපාලන වුවමනා මත මෙහෙයවූ බව පැහැදිලි වෙනවා.

මෙය සැලසුම්සහගත සිදුවීමක්. ක්‍රියාත්මක කර තිබෙන්නේ එකම තැනකින්. ඒ පිළිබඳව සාක්ෂි අපි පොලීසියට  ලබා දී තිබෙනවා. නිට්ටඹුව පොලීසියට මේ පිළිබඳව පැමිණිලි කොට තිබෙනවා. ඔවුන් අල්ලා ගැනීමට යාමේදී මහර අපේ සෙනරත් නම් සහෝදරයෙකුටත් තුවාල සිදුවී තිබෙනවා. මේ රටේ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරනවා. අපි මේ රටේ දේශපාලන පක්ෂයක් විදිහට ජනතාවගේ ආශිර්වාදය මැදින් මේ ගමන යමින් සිටිනවා. මෙවැනි නින්දිත සිදුවීම්වලින් අපි, අපේ සාමාජිකයන්, අපේ ආධාරකරුවන් තව තවත් ධෛර්යමත් වෙනවා. මෙවැනි නින්දිත ක්‍රියා නතර කරන ලෙස අපි ආණ්ඩුවට බල කරනවා. ජාතික ජන බලවේගය ලෙස අපි ඉදිරියට යද්දී අපේ පක්ෂයේ නායක අනුර දිසානායක සහෝදරයාට හෝ අපගේ ඕනෑම සහෝදරයෙකුගේ ජීවිතයට යම් අනතුරක් ඇති කළොත් ඊට වගකිව යුත්තේ මොවුන් බව මෙම සිදුවීම්වලින් ඉතාම පැහැදිලියි. මේ අවදානමත් අපි මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

මෙම සිදුවීමට සම්බන්ධ සියලු වරදකරුවන්ට නීතිය ක්‍රියාත්මක කරන ලෙස අපි බල කර සිටිනවා. නිස්සංක සේනාධිපති යටතේ සිටින මෙවැනි අය නීච වැඩවල නිරතවනවානම් ජනාධිපතිවරයා මේ සම්බන්ධයෙන් වහා ක්‍රියාමාර්ග ගත යුතුව තිබෙනවා. එසේ නැතුව මේ පොඩි මිනිසුන්ගේ සාක්ෂි වෙනස් කර ගැලවෙන්නට හදන්න එපා. මෙය කාගේ වුවමනාවට සිදුවූ දෙයක්ද යන්න මුළු ලෝකයම දන්නවා. එක් පුද්ගලයෙක් ප්‍රසන්න රණතුංගගෙන් ඕනෑ දෙයක් කර ගත හැකි යැයි තමන්ට කී බව කියනවා. මේ සිද්ධිය පිටුපස දේශපාලනය ඉතාම පැහැදිලියි. දැන් වගකීම ඇත්තේ ජනාධිපතිවරයා අතයි. මේ සිදුවීම පිළිබඳව පරීක්ෂණ පවත්වා සාධාරණය ඉටු කරනු ඇතැයි ජනතාව බලාපොරොත්තුවෙන් ඉල්ලනවා. ආණ්ඩුව එසේ නොකරන්නේනම් මේ ආණ්ඩුව පලවා හැර එසේ කිරීමේ වගකීම ජනතාව බාරගනීවි."

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com





ගොවි සටනට සවියක් වී... - ඇඹිලිපිටිය



වැඩබිමේ තරුණයන් JVP Youth සමග...



තරුණ පෙළ දිරිගැන්වීමට සහය දී... - පස්යාල



හුස්ම පොද රැකගැනීම වෙනුවෙන්... - මහියංගණය



සිසු දරුදැරියන්ට අත්වැලක් වී... - ත්‍රිකුණාමලය



නැගෙනහිර තරුණයන්ට ක්‍රීඩා භාණ්ඩ ලබාදී...

# මැතිවරණය කල් තැබීම ජනතා පරමාධිපත්‍යයට පයින් ගැසීමක්! ප්‍රජාතන්ත්‍ර විරෝධී තීරණය පරාජය කළ යුතුයි



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්
**ටිල්වින් සිල්වා සහෝදරයා**

අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් ආණ්ඩුව පළාත් පාලන ආයතනවල කාලය තවත් වසරකින් කල් දමා ඇති බවත් ආණ්ඩුව ජනතාව ඉදිරියට යාමට බිය වී තිබෙන බවත් මෙසේ කිරීමට හේතු නොදක්වා ආණ්ඩුව නිහඬව සිටින බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, මෙමගින් සිදුව ඇත්තේ ජනතා පරමාධිපත්‍යයට පයින් ගැසීමක් බව පෙන්වා දුන්නේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 11වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා, මෙසේද ප්‍රකාශ කළේය.

"පළාත් පාලන මැතිවරණය වසරකින් කල් තැබුවේ ඇයිදැයි කියන්නැයි අපි ආණ්ඩුවට අභියෝග කරනවා. පළාත් පාලන පනතට අනුව ඇමතිවරයාට ඒවා වසරකින් කල් තැබීමට අවසරය ලබා දී තිබෙනවා. බලය ලබා දී තිබෙන්නේ කිසියම් සාධාරණ හේතුවක් මත ඒවා කල් තැබීමටයි. නමුත් කිසිදු හේතුවෙක් මේ දක්වා ආණ්ඩුවෙන් ඉදිරිපත් වී නැහැ.

ආණ්ඩුව ඡන්දවලට බියවෙන්නට පටන් අරන් ඇති බව අපට පැහැදිලියි. ආණ්ඩුව ජනතාව ඉදිරියට යාමට බිය වී තිබෙනවා. ඒ බිය හැරෙන්නට වෙනත් කිසිදු හේතුවක් නැහැ. රට සාමාන්‍ය තත්වයට පත් කරපු වෙලාවක ආණ්ඩුවට කොවිඩ් හේතුවක් ලෙස ඉදිරිපත් කළ නොහැකියි. මේ වන විට ඉතිහාසයේ පැවති කිසිදු ආණ්ඩුවක් පත් නොවූ තරමේ වේගයෙන් මේ ආණ්ඩුව කඩා වැටෙමින් තිබෙනවා. ජනතාව අතර අප්‍රසාදයට පත් වෙමින් තිබෙනවා. තමන්ට ජනතා කැමැත්තක් නොමැති බව ආණ්ඩුව දන්නවා. තමන්ට ජනවරමක් නොමැති වීම නිසා ආණ්ඩුව මැතිවරණය කල් තබා තක්කඩි වැඩක් කරනවා.

ආණ්ඩුව මේ හදන්නේ තමන්ට හිමි නැති බලයක් වසරක් පවත්වා ගැනීමටයි. ඡන්දයක් පැවැත්වුවහොත් මේ පළාත් පාලන ආයතනවල ආණ්ඩුවට පවතින බලය නැතිවෙනවා. ආණ්ඩුව වසරකින් එය කල් තැබූ විට ආණ්ඩුව තමන්ට හිමි නැති බලයක් තවත් වසරක් පවත්වා ගෙන යනවා. මෙය ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරක්. ඒ වගේම ආණ්ඩුව සදාචාර විරෝධී ලෙස පළාත් පාලන ආයතන තුළ තවත් වසරක් බලයේ ඉන්න උත්සාහ කරනවා. මෙහිදී සිදුව ඇත්තේ ජනතා පරමාධිපත්‍යයට පයින් ගැසීමක්.

අපි ජනතාවට කියන්නේ මේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී තක්කඩි ක්‍රියාවක් බව හඳුනා ගන්නා ලෙසයි. ඡන්දය ඔබේ අයිතියයි. ඔබේ පළාත් පාලන ආයතනයට අලුතින් නියෝජිතයින් පත්කර ගැනීමේ අයිතියක් ඔබට තිබෙනවා. ඒ වෙනුවෙන් ඔබ සටන් කළ යුතුව 11 වැනි පිටුවට

# සිතිවිලි අලුත් කරගෙන සමාජය වෙනස් කරන පුරවැසියන් විය යුතුයි



ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක
**සමන්මලී ගුණසිංහ සහෝදරිය**

පහුගිය වසර 73ක පාලනය කාලය තුළ කණ්ඩායම් දෙකක් රට පාලනය කර රට මහත් ව්‍යසනයකට ඇද දමා ඇති බවත් තවදුරටත් පාලන කණ්ඩායම් දෙකෙන් රටට හොඳ පාලනයක් ලැබෙනු ඇති බවට විශ්වාස කළ නොහැකි බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික සමන්මලී ගුණසිංහ සහෝදරිය, නව වසරේ නව ඇඳුම් අඳින අයුරින් තමන්ගේ සිතිවිලි අලුත් කර හෙට දවසේ සමාජය වෙනස් කරන පුරවැසියන් බවට පත්වන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

සමන්මලී ගුණසිංහ සහෝදරිය මේ අදහස් පළ කළේ පසුගිය 02වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කරමින් ඇය මෙසේද කිය සිටියාය.

"මිනිස්සු අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබාගන්න බැරිව ඉතාම පීඩාවකට පත්වෙලා. භාණ්ඩ මිල 40%කින් 50%කින් වැඩිවෙලා. සමහර භාණ්ඩ 100%කින්ම වැඩි වෙලා. පෝලිම්වල ඉඳගෙන මිනිස්සු ආණ්ඩුවට දෙස් දෙවොල් තියනවා. කුඩා දරුවා වඩාගෙන අම්මලා පෝලිම්වල. පාන්දර තුනට හතරට ඇවිල්ලා පෝලිම්වල හිටියත් ගෑස් එකක් ගන්න බැහැ. ගැබිණි මව්වරු, දරුවන් වඩාගත්ත අම්මලා තවත් දවස් කීයක් ගෑස් පෝලිම්වල ඉන්නද?

දිනෙන් දින භාණ්ඩ මිල වැඩිවෙන එක ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙන ගානට තමයි ඇමතිවරු කතා කරන්නේ. කිරි පිටි පෝලිම්, ගෑස් පෝලිම්, හාල් පෝලිම් සාමාන්‍ය දෙයක් බවට පත්වෙලා. මිල පාලනයක් කරන්න ආණ්ඩුවට නොහැකි වෙලා. සිමෙන්ත මිල දිනෙන් දින ඉහළ යනවා. රුපියල් නවසිය ගණන් වල තිබුණ සිමෙන්ති කොට්ටය දැන් 1500කටවත් ගන්න විදියක් නැහැ. කිරි පිටි මිල දෙවතාවක් වැඩි කළා. වැඩි මිලටවත් කිරිපිටි පැකට් එකක් ගන්න නොහැකි වෙලා.

ආණ්ඩුවේ සෞභාග්‍යය ජනතාවට කොහොම දැනෙනවා ඇතිද? සංඛ්‍යාලේඛන කිහිපයක් ගත්තාම ඒක කියන්න පුළුවන්. දරුවන්ගේ ඌනතා රෝග බහුල වෙලා. දරුවන්ගේ වයසට සරිලන උස නැහැ. උසට සරිලන බර නැහැ. විටමින්, යකඩ ඌනතා ඇතිවෙලා. පාසැල් යන වයසේ දරුවන්ගෙන් 60%ක් විවිධ ඌනතා රෝග යන්වලින් පෙළෙනවා කියලා 2019 වර්ෂයේ ආණ්ඩුවේම සංඛ්‍යාලේඛනවල තියෙනවා. එම නිසා පාසැල් ළමුන්ගෙන් 90%කට හොඳ පෝෂණය සහිත දිවා ආහාර වේලක් ලබාදෙන්න යෝජනා කරනවා. නමුත් අපේ රටේ දෙමාපියන්ට තමන්ගේ දරුවන්ට පෝෂ්‍යදායි ආහාර වේලක් ලබාදෙන්න නොහැකිවී තියෙනවා."

# ජාතික සම්පත් විකිණීමේ උත්සාහය පරාජය කළ යුතුයි



ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික
**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

ආණ්ඩුව ඉතාමත් රහසිගත ආකාරයෙන් කැබිනට් සංදේශයක් මගින් ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ඉන්දියාවට පවරා දීමේ ගිවිසුමක් අත්සන් කර ඇති බවත් මෙය රට යළි ගොඩගෙන දියුණු රටක් බවට පත්කිරීමට දෑස් දල්වාගෙන සිටින සියලු දෙනාගෙම ප්‍රශ්නයක් බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, ආසියාවේ අභිමානයක් ඇතිව ජීවත් විය යුතු රටක් නිරුවත් කරන මෙම ජාතික සම්පත් විකිණීමේ ක්‍රියාවලිය තීරණාත්මක ලෙස පරාජය කළ යුතු බව අවධාරණය කළේය.

හඳුන්නෙත්ති සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 12වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවේදීය.

මෙහිදී තවදුරටත් අදහස් දැක්වූ සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"මේ ගිවිසුම අත්සන් කිරීම පිළිබඳව බලශක්ති අමාත්‍යාංශය සහ ඛනිජ තෙල් සංස්ථාව පත්තර දැන්වීමක් පළ කර තිබුණා. මේ ගිවිසුම අත්සන් කිරීම සාධාරණීකරණය කරන්න විවිධ කරුණු දැන්වීමේ ඉදිරිපත් කර තිබෙනවා. ඔවුන් කියන්න උත්සාහ කරන්නේ ජාතික කොඩිය ත්‍රිකුණාමලයේ සිටුවන බවයි. නමුත් මුළු ක්‍රියාවලිය අධ්‍යයනය කළාම පැහැදිලි වෙන්නේ ජාතික කොඩිය ත්‍රිකුණාමලයෙන් ගලවන බවයි. අපිට ගෑස් සිලින්ඩරයේ ප්‍රශ්න තිබෙනවා. ඊළඟ වේල කන්නේ කොහොමද කියලා ප්‍රශ්නයක් තියෙනවා. දරුවන්ට පොත් ටික ගැනීම ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රශ්න රාශියකින් හැම කෙනෙක්ම වෙළිලා ඉන්නවා. හැබැයි ඒ ඔක්කොම ප්‍රශ්න විසඳා ගන්න අපිට රටක් තියෙන්න ඕනෑ. ජනතාවට තිබෙන අමාරුකම්, බැරිකම් පිට දාලා අපේ රටට විදේශ විනිමය ගේන්න තියෙන, අනාගත සුරක්ෂිතභාවය ආරක්ෂා කරන්න තියෙන ජාතික සම්පත් විකුණන්න දෙන්න එපා. තුන්වැනි ලෝක යුද්ධයක් ඉස්සරහා භූ දේශපාලනික තර්ජනයක් අපේ රටට තිබෙනවා.

මේක තෙල් සංස්ථාවේ ප්‍රශ්නයක් නෙවෙයි. මේක වෘත්තීය සමිති ප්‍රශ්නයක් නෙවෙයි. මේක ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රශ්නයක් නෙවෙයි. මේ රට දිහා ආදරයෙන් බලා ඉන්න, මේ රට යළි ගොඩනග 11 වැනි පිටුවට


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.